DOI: https://doi.org/10.4038/kalyani.v36i1.66

*KALYĀNĪ: Journal of the University of Kelaniya, ISSN - 2012-6859, Volume XXXVI (Issue I), 2022*

# An Exploratory Study of the Creation of Elephant clothes (Based on Dalada Maligawa, Kandy)

**P.S. Godakanda[1]**

## Abstract

Perahara is one of the prominent thing among the Sinhalese cultural events. Among all the elements related to it, the elephant has a main place. The elegance and spectacularity of each elephant depends on the clothes. Hese clothes, which are beautifully finished with different colors, shapes and beautiful patterns, increase the weight of the elephant and also become the main reason to win the audience's attraction. Therefore, the purpose of this research is to inquire about the techniques and practices related to the creation of elephants clothes. The research problem here is to investigate whether the elephant dress has a cultural value beyond the beauty expected from the clothes. For that, the main source is academic writing and research theses associations of standard scholars. Other than that data is collected through the interviews and questionnaires with secretory of Dalada Maligawa, Kandy, Gajanayaka Nilame, Mr. Jyathissa Ahalamalpe the person who dress up the Mangala atha Elephant dress designers. Even though it is a beast, elephant clothes are a special aspect related to the Sinhala culture, and this shows that the design of the clothes of the elephant is a cultural element based on respect and devote.

**Key words :** Creating, Cultural Value, Elephant Clothes, Folk Lore, Perahara Culture

# හස්ති වස්ත්‍රාභරණ නිර්මාණය පිළිබඳ ගවේෂණාත්මක අධ්‍යයනයක් (මහනුවර ශ්‍රී දළදා මාළිගාව ඇසුරෙනි)

**පී. එස්. ගොඩකන්ද**[1]

**සාරසංක්ෂේපය**

පෙරහැර සිංහල සංස්කෘතිකාංග අතර ප්‍රමුඛත්වයෙහි ලා සැලකෙයි. ඒ හා සම්බන්ධ සකලවිධ අංගයන් අතර හස්තියාගේ භූමිකාව සුවිශේෂ වූවකි. කරඬුව වඩම්මන මංගල හස්තිරාජයාගේ සිට පෙරහැරට සම්බන්ධ වන සෙසු සෑම හස්තියෙකුගේ ම දර්ශනීයත්වය හා විචිත්‍රත්වය රඳා පවතින්නේ ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් මතය. විවිධ වර්ණයෙන් හැඩයෙන් හා අලංකාර මෝස්තරවලින් සමලංකෘතව නිමවන ඒ ඇඳුම් විලාසිතා හස්තියාට උරුම මහේශාඛ්‍ය බව ගර්වය හා භක්තිය තීව්‍ර කරන අතර ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගැනීමෙහි ද මුඛ්‍ය සාධකය බවට පත්වෙයි. එබැවින් හස්තියාගේ ඇඳුම නිර්මාණය හා සම්බණ්ධ ශිල්ප ක්‍රම සහ ඒ හා බැඳුණු වත්පිළිවෙත් පිළිබඳව විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණයි. වස්ත්‍රාභරණවලින් අපේක්ෂිත අලංකරණය නම් වූ සාධකය අභිභවා ගිය සංස්කෘතිකමය අගයක් හස්තියාගේ වස්ත්‍රාභරණකරණයේ වේ දැයි ගවේෂණය කිරීම මෙහි පර්යේෂණ ගැටලුවයි. ඒ සඳහා ප්‍රධාන මූලාශ්‍රය ලෙස ප්‍රාමාණික උගතුන්ගේ අදහස්, ශාස්ත්‍රීය ලේඛන සහ පර්යේෂණ නිබන්ධන ඇසුරු කෙරේ. ඊට අමතරව මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ලේකම්තුමා, ගජනායක නිලමේ, මංගල හස්තියාගේ භූෂණ කාර්යය සිදු කරන ජයතිස්ස ඇහැළමල්පේ මහතා සහ හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන් හමු වී සම්මුඛ සාකච්ඡා සහ ප්‍රශ්නාවලි මඟින් තොරතුරු එක්රැස් කෙරේ. තිරිසන්ගත සත්ත්වයෙකු වස්ත්‍රාභරණයෙන් සැරසීම සිංහල සංස්කෘතිය හා බැඳුණු විශේෂිත කරුණක් වන්නා සේ ම හස්තියාගේ වස්ත්‍රාභරණ නිර්මාණය ගෞරවය හා භක්තිය පදනම් කරගත් සංස්කෘතික අංගයක් බව මෙමඟින් නිරීක්ෂණය වෙයි.

**ප්‍රමුඛ පද :** ජනශ්‍රැතිය, නිර්මාණය, පෙරහැර සංස්කෘතිය, සංස්කෘතික අගය, හස්ති වස්ත්‍රාභරණ

[1] පශ්චාත් උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය
pabasarasev@gmail.com https://orcid.org/0009-00008715-0025

## 1. හැඳින්වීම

සත්ත්ව ලෝකයේ දැවැන්තයා ලෙස සැලකෙන හස්තියා පිළිබඳ සංකල්පය ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් විකාසනය වන්නකි. අලි ඇතුන් පිළිබඳ දැඩි අවධානයක් යොමු වූ එවක පටන් අලි ඇත්තු අල්ලා ගැනීම, හීලෑ කිරීම සහ පුහුණු කිරීම මඟින් මිනිසුන් සිය දෛනික ජීවිතයේ කටයුතු සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගත්තේය. මිනිසාට එසවිය නොහැකි විශාල බරක් ඔසවාගෙන යාමට, ඉදිකිරීම් සඳහා පොළොව සමකර ගැනීමට සහ ඇතැම් විටෙක ගමනාගමන කටයුතු සඳහා ද අලි ඇත්තු භාවිත කළේය. ඒ හැර හස්තීන් යුදමය කටයුතු සඳහා පුරුදු පුහුණු කර යුද පෙරමුණේ යෙදවූ අවස්ථා ද නැතිවා නොවේ. එය හස්තීන්ගේ තත්ත්වය තරමක් වර්ධනීය වූ අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. එනම්, සාමාන්‍ය මිනිසාගේ දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් වඩාත් පහසු කර ගැනීම සඳහා යොදා ගත් මොවුන් රාජතාන්ත්‍රික මට්ටමෙන් ගරු බුහුමනට පත්වීමත් සමඟ ම ඔවුන් විෂයෙහි සමාජයෙහි පැවති තත්ත්වය ද මුළුමනින් ම වෙනස් විය.

බුද්ධ කාලයේ පටන් ම බුදු දහම සමඟ දක්වන ලද ඥාතීත්වය නිසා සිංහල සමාජ සංස්කෘතියේ ද හස්තියාට අසීමිත ගෞරවයක් හා ආදරයක් හිමි විය. බුද්ධ වන්දනාව මූලික වී ආරම්භ වූ පෙරහැර සංස්කෘතියේ දී එය රාජකීයත්වය අභිභවා ගිය පූජනීය වස්තුවක් ලෙස වන්දනීයත්වයට පාත්‍ර විය. තිරිසන්ගත සත්ත්වයෙකු වුව ද පෙරහැර මංගල්‍යයේ වැදගත් ම සහ ප්‍රමුඛතම අංගය වන සධාතුක කරඬුව වැඩම කරවීමට තරම් හස්තියා භාග්‍යවන්ත වීම ඊට හේතුවයි. මුල් කාලීනව රජුගේ මංගල හස්තියා මෙම කාර්යයට යොදා ගැනුණි. එම නිසා වර්තමානය වන විටත් මංගල නම් වූ කුලයට අයත් සද්දන්ත හස්තියෙක් ඒ සඳහා යොදා ගැනීම සම්ප්‍රදායකි. පෙරහැර සංස්කෘතියේදී හස්තියා විෂයෙහි විශේෂාවධානයක් යොමු වන අනෙක් කරුණ නම්, පෙරහැරෙහි ගමන් කරන හස්තීන් වෙනුවෙන් ම නිර්මාණය වන අලංකාර ඇඳුම් කට්ටලයයි. එය දර්ශනීයත්වය, විචිත්‍රත්වය යන කාරණා අභිභවා හස්තියාට උරුම මහේශාක්‍ය බව, ගෞරවය, භක්තිය හා ප්‍රේක්ෂක

ආකර්ෂණය දිනා ගැනීමෙහි ප්‍රමුඛ සාධකය බවට පත්වේ. අද වන විට පෙරහැර මංගල්‍යයක දී පමණක් මූලිකව දකින්නට ලැබෙන මෙම හස්ති වස්ත්‍රය එක්වර ම සකස් වූවක් නොව අතීතයේ පටන් ක්‍රමිකව සකස් වූවකි. නමුත් හස්තීන් සඳහා වස්ත්‍ර නිර්මාණය කිරීම යනු මනා සංයමයකින්, ඉවසීමකින් සහ විශාල පිරිසකගේ දායකත්වයක් සහිතව ක්‍රමානුකූලව හා සැලසුම් සහගතව සිදු කළ යුතු සංකීර්ණ කර්තව්‍යයකි. සියලු අලංකාර ඇඳුම් ආයිත්තම්වලින් සැරසී තේජාන්විතව පෙරහැරෙහි ගමන් කරන අලි ඇතුන්ගේ චමත්කාරය නෙතට ප්‍රිය දසුනක් වුව ද, ඒ පිටුපස අසන්නට දකින්නට බොහෝ දේ ඇත්තේ ද ඒ නිසාය.

නමුත් ලංකාවේ පෙරහැර සංස්කෘතියේ දකින්නට ලැබෙන පෙරහැර ප්‍රමාණය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගන්නා නිසා එම සෑම පෙරහැරක් ම පාහේ මෙම අධ්‍යයනයට හසු කර ගැනීම අපහසුය. එම එක් එක් පෙරහැර මංගල්‍ය අනුව අලි ඇතුන්ගේ ඇඳුමේ සහ ඊට අනුබද්ධ අංශවල සම්ප්‍රදායන් අනුව පවතින විවිධ වෙනස්කම් හඳුනා ගන්නට ලැබීම ඊට හේතුවයි. සමස්තයක් වශයෙන් ගෙන එම එක් එක් වෙනස්කම් විමර්ශනය කළ හැකි වුව ද, එය වඩාත් පුළුල් පරාසයක් දක්වා විහිද යන බැවින් අධ්‍යයනයේ පහසුව පිණිස හස්ති වස්ත්‍රාභරණ නිර්මාණය පිළිබඳව කෙරෙන මෙම පර්යේෂණය සකස් වන්නේ මහනුවර ශ්‍රී දළදා මාළිගාව ඇසුරෙනි.

## 2. ක්‍රමවේදය

පූර්ව කියැවීම් හා න්‍යායාත්මක ප්‍රවේශයන්ට අවශ්‍ය දත්ත ලබා ගැනීම සඳහා පුස්තකාල අධ්‍යයනය යොදා ගැනිණ. මෙහිදී අලි ඇතුන්, පෙරහැර සංස්කෘතිය හා දළඳාව සම්බන්ධ දේශාටන වාර්තා ඇතුළු ඊට අදාළව මෙතෙක් ලියැවී ඇති සාහිත්‍ය විමර්ශන පරිශීලනය කිරීම සිදු විය. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අධ්‍යයනයට බඳුන් කෙරෙන විෂය පිළිබඳව ප්‍රාමාණික උගතුන් සහ මහනුවර ශ්‍රී දළඳා මාළිගාවේ නිලධාරීන්, හස්ති වස්ත්‍රාභරණ නිර්මාණ ශිල්පීන් හා භූෂණ ශිල්පීන් හමුවී සම්මුඛ සාකච්ඡා පවත්වා තොරතුරු එක්රැස් කෙරිණ. ද්විතීය මූලාශ්‍රය ලෙස විෂය පිළිබඳව

ප්‍රාමාණික උගතුන් විසින් රචිත පොත්පත් හා ලිපි ලේඛන දේශාටන වාර්තා, වංශකතා හා ඉතිහාස ග්‍රන්ථ ආදී ඓතිහාසික සහ සාහිත්‍යයික මූලාශ්‍රය, වෙබ් අඩවි, විද්‍යුත් ලේඛන, ඡායාරූප සහ වීඩියෝපට වැනි සම්පත් යොදා ගැනුණි.

## 3. ප්‍රතිඵල හා සමාලෝචනය

### 3.1. ශිල්පීන්ගේ සූදානම

හස්ති වස්ත්‍රය අන්දවන්නේ තිරිසන්ගත සත්ත්වයෙකුට වුව ද හස්තියා යනු, රාජකීය පැසසුම් හා සැලකුම් ලැබූ සත්ත්වයෙකු බව අමතක නොකළ යුතුය. රජුගේ මංගල රථය හා විශ්වාසවන්ත යුද සගයා ලෙස කාගේත් ආදරය දිනාගත් අලි ඇතුන්ගේ තේජවන්තභාවය ම පමණක් එම සත්ත්වයා පෙරහැරක ගමන් කරවීමට හෝ ගෞරව කිරීමට හේතුවක් නොවන බව සැබෑය. නමුත් බුදු සිරිත සමඟ දක්වන ඥාතිත්වයත්, දරා ගැනීමට ඇති අසහාය ශක්තියත් යන කාරණා එක්ව ගත්කල පෙරහැරක ගමන් කරවීමට හෝ සධාතුක කරඬුව උරමතට ගැනීමට සද්දන්ත කුලයේ අලි ඇතුන් තරම් සුදුස්සෙකු තවත් නොවීය. මුළු මහත් සමාජයක් වන්දනා කරන ගෞරව කරන මෙම සත්ත්වයා වෙනුවෙන් ඇඳුමක් නිර්මාණය කිරීම, භාග්‍යයක් සහ පුණ්‍යකර්මයක් බව වරෙක තදානි මහතා ද පවසයි.[81] දළඳා වහන්සේ වන්දනාමාන කරන තරම් සද්භාවයකින් ම තෙරුවන් වැඳ හස්ති වස්ත්‍ර නිර්මාණ කාර්යය ආරම්භ කිරීමට තත් නිර්මාණ ශිල්පීන් පෙලඹෙන්නේ ද එම නිසාය.

සාමාන්‍ය ඇඳුමක් මැසීමට විශාල පෙර සූදානමක් හෝ පේ වීමක් අවශ්‍ය නැත. එහෙත් පෙරහැරේ අලි ඇතුන්ට නිර්මාණය කරන ඇඳුම් මැසීම ආරම්භ කරන්නේ තරමක් වෙනස් ආකාරයෙනි. එය දළඳා මාළිගාවේ ද, කතරගම දේවාලයේ ද යන්න විශේෂ නොවේ. ඇඳුම මැසීමේ දී අනුගමනය කරන පිළිවෙළෙහි යම් යම් වෙස්කම් පැවතිය හැකි වුවත් සෑම හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පියෙක් ම සිය කාර්යය

---

[81] තදානි, 2020.04.23

ආරම්භ කරන්නේ එක ම ආකාරයකටය. ඒ අසල විහාරස්ථානයකට ගොස් මල් පහන් පුදා තුනුරුවන් නමස්කාර කොට ආශිර්වාදය ලබා ගැනීමෙනි. ඇතැම් විට නැකැත් බලා සුබ මුහුර්තයෙන් කටයුතු ආරම්භ කරන අවස්ථා ද වෙයි. භූෂණ ශිල්පීහු පවා වෙසක් පුර පසළොස්වක පොහොය අවසන් වනවාත් සමඟ කිලි ගෙවල්වලට යාමෙන් වැළකී ඒ වෙනුවෙන් ම පේවෙති.[82]

එහෙත් එය අලි ඇතුන් වෙනුවෙන් සිදුකරන කාර්යයක් වුවත්, දළදා පූජාවේ ම සුවිශේෂී අංගයකි. විශේෂයෙන් ම සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියා ඒ වෙනුවෙන් ම පේවී සූදානම් වන බව ඇත් ගොව්වෝ කියති. මෙසේ පෙරහැර කරඬුව රැගෙන ගමන් කරන මංගල හස්තියාගේ දර්ශනය ද ඉතා මනරම් හා ගම්භීර වූවකි. විශේෂයෙන් එදින ඇතාගේ සුපුරුදු හැසිරීම් රටාවට වඩා වෙනස් වූ හික්මීමක් හා ශික්ෂණයක් ද දැකිය හැකි වෙයි. මේ පසුබිම තුළ හස්තියාට ගෞරවාන්විත බවක් ආරෝපණය වන හෙයින් එවැනි හස්තියෙකු විෂයෙහි නිමැවෙන ඇඳුම පවා නිර්මාණය වන්නේ එබඳු ම වටපිටාවක් තුළ ය.

### 3.2. අලි ඇතුන්ගේ ඇඳුම් කට්ටලය හා එහි අංග

ප්‍රධාන වශයෙන් ම හස්ති වස්ත්‍රාභරණ නිර්මාණය වන්නේ පෙරහැර මංගල්‍ය සඳහා සම්බන්ධ වන අලි ඇතුන් වෙනුවෙනි. නමුත් පෙරහැරක ගමන් ගන්නා ප්‍රධාන දළ ඇතුන් කිහිප දෙනා (පෙරමුණේ රාළ ගමන් ගන්නා හස්තියා, ගජනායක නිළමේ ගමන් ගන්නා හස්තියා, බෞද්ධ කොඩිය රැගෙන යන ඇතා, මංගල හස්තිරාජයා සහ දෑළේ ඇතුන් දෙදෙනා, පෙරහැර කරඬුවට ඉදිරියෙන් ගමන් ගන්නා ඇතුන් තිදෙනා) සහ අවශේෂ අලි ඇතුන්ගේ ස්වරූපය අනුව ඔවුන්ට අන්දවනු ලබන ඇඳුම ද යම් ප්‍රමාණයකට එකිනෙකින් වෙනස් වෙයි. ඒ, හස්ති වස්ත්‍රයක පවතින ප්‍රධාන අංග හා අවශේෂ අංගවලිනි. සාමාන්‍යයෙන් කිසියම් විහාරස්ථානයක් හෝ දේවාලයක් මූලික කරගෙන පවත්වනු


[82] අසංග, 2022.05.02

ලබන පෙරහැර මංගල්‍යයක දී වුව ද සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තිරාජයාගේ සහ පෙරහැරට සම්බන්ධ වන සෙසු අලි ඇතුන්ගේ ඇඳුමෙහි පැහැදිලි වෙනසක් දක්නට ලැබේ. විශේෂයෙන් ම මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ඇසළ පෙරහැර, කතරගම දේවාලයේ ඇසළ මහා පෙරහැර, රත්නපුර මහා සමන් දේවාලයේ ඇසළ මහා පෙරහැර, කෝට්ටේ රජමහා විහාරයේ ඇසළ පෙරහැර යනාදී විවිධ පෙරහැර මංගල්‍යයන්හිදී එයට සහභාගි කරවන අලි ඇතුන්ගේ ඇඳුම්වල මේ වෙනස්කම් දැකිය හැකිය. ඒවායෙහි පිළිගත් සම්ප්‍රදායයන් හා චාරිත්‍ර වාරිත්‍රවල පවතින විවිධ වූ වෙනස්කම් ඊට හේතුවයි. එසේ අලි ඇතුන් සඳහා නිර්මාණය වන ඇඳුම් කට්ටල එකිනෙකින් වෙනස් වන්නේ කෙසේද යන්න සොයා බැලීමට පෙර හස්ති වස්ත්‍රාභරණ කට්ටලයකට ඇතුළත් වන අංග පිළිබඳව අවබෝධයක් පළමුව ලබා ගත යුතුය. එ අනුව අලි ඇතුන් සඳහා නිර්මාණය වන ඇඳුම ප්‍රධාන වශයෙන් කොටස් කිහිපයකි.

- **නෙත්තිමාලය** - හිස සහ හොඬවැල වැසෙන සේ අන්දවන පළඳනාව
- **කන් පෙති** - කන් දෙක වැසෙන සේ අන්දවන ඇඳුම
- **පිට රෙද්ද ඇගේ ඇඳුම ඇත්හැට්ටය (නුවර අය)** - කඳ වැසෙන සේ අන්දවන ඇඳුම
- **කර පටිය උරමාලෙ කපුතැල්ල** - දම්වැල් වැසෙන සේ කරට පළඳවන පළඳනාව

එහෙත් මෙම කොටස්වලින් සාමාන්‍ය හස්තියෙකුගේ ඇඳුම සඳහා අයත් වන්නේ පිට රෙද්ද, කන් පෙති හා නෙත්තිමාලය පමණි. නමුත් සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තිරාජයාගේ ඇඳුම් කට්ටලය ඉහතින් කී කොටස්වලට අමතරව තවත් අංග කිහිපයකින් සමන්විත වෙයි.

**3.1. රූපය** මංගල හස්තියාගේ ඇඳුම් කට්ටලය




| | |
|---|---|
| 01 - **ඇත් හැට්ටය** | 06 - **පා සලඹ** |
| 02 - **නෙත්තිමාලය** | 07 - **දළ කොපු සහ සමන්පිච්ච මල් මාලා** |
| 03 - **කන්පෙති** | 08 - **පාවඩය** |
| 04 - **චාමර** | 09 - **වියන** |
| 05 - **උරමාලය** | |

### 3.2.1. වතපුටුව

මංගල හස්තිරාජයාගේ පිට මත තබන රන්සිව්ගෙය තැන්පත් කරන්නේ වතපුටුව මතයි. සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියා වාහල්කඩින් ඇතුළු වූවාට පසුව ඇතුගේ පිටට පිරිත් පැන් ඉස පිරිත් පැන් පොවා අනතුරුව ඇතුගේ පිට මතත්, බඳ කොටසේත් මෙට්ට තබා බැඳ ඒ සඳහා ම වන විශේෂිත කේබල් වර්ගයකින් එය හොඳින් සවිවන සේ ඇතුගේ බඩ යටින් දමා සම්බන්ධ කරයි. වතපුටුව බඳින්නේ

ඒ මත ය. මෙය කිලෝ 50ක් පමණ බරය. දළදා මාළිගයේ හැර වෙනත් විහාරස්ථාන හෝ දේවාලයවල ඇති රන්සිවි ගෙවල් වතපුටුවට ම සම්බන්ධ වී ඇත.

3.2 **රූපය** වතපුටුව බැඳීම



### 3.2.2. රන්සිවිගෙය

සධාතුක කරඬුව තැන්පත් කරන්නේ මංගල හස්තියාගේ පිට මත බැඳි රන්සිවිගෙය තුළයි. ඒ වෙනුවෙන් ම සකස් කළ විශේෂිත කොට්ටයක් මාළිගයේ ඇත. මහනුවර දළදා පෙරහැරේ දී නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන සිව් මහා දේවාලයවලින් කුඹල් පෙරහැර 5 සහ රන්දෝලි පෙරහැර 5 සඳහා ගෙන යනු ලබන රන්සිවිගෙවල් එකිනෙකින් වෙනස් වන අතර ඒවා සංඛ්‍යාත්මකව 8කි.

**3.3 රූපය** පෙරහැරෙහි ගෙන යනු ලබන රන්සිවිගෙය



### 3.2.3. චාමර

අතීතයේ දී රජුට ගෞරව දැක්වීමක් වශයෙන් පවන් සැලීම සඳහා යොදා ගත්තේ චාමරය. එබැවින් දළදා වහන්සේට සිදු කරන ගෞරවයක් ලෙස සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තිරාජයාගේ ඇඳුම් කට්ටලයට ද චාමර එක් වෙයි.

**3.4 රූපය** චාමර



### 3.2.4. උඩු වියන හා පාවඩය

අවසන් රන්දෝලි පෙරහැර දෙකේ දීත්, දවල් පෙරහැරේ දීත්, ගෙඩිගේ විහාරයට කරඬුව තැන්පත් කිරීම සඳහා යන රාත්‍රී පෙරහැරේ දී මෙන් ම ගෙවැදීමට යන දවල් පෙරහැරේ දීත් සධාතුක කරඬුවට උඩු වියන් ඇල්ලීම සහ මංගල හස්තියාට පාවඩ එළීම සිදුවේ. එය මහා රන්දෝලි පෙරහැර හෙවත් පෙරහැර මංගල්‍යයේ උත්කර්ෂවත් ව පෙරහැරේ දී ගෞරවය කියා පෑමක් වශයෙන් භාවිත වෙයි.

**3.5 රූපය** දළඳා පෙරහැරෙහි රැගෙන යන උඩු වියන (මහනුවර ශ්‍රී දළඳා මාළිගාවේ කෞතුකාගාරය)



### 3.2.5. දළ කොපු

සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තිරාජයාගේ සහ ඔහු සමඟ දැළ ගමන් ගන්නා ඇතුන් දෙදෙනාගේ ද දළවල ආරක්ෂාව පිණිසත්, අලංකාරය පිණිසත් ඇත් දළ ආවරණය කරමින් ඒවාට කොපු පලඳවනු ලැබේ.

**3.6 රූපය** දළ කොපු



### 3.2.6. සමන්පිච්ච මල් මාලා

මංගල හස්තිරාජයාගේ දළ දෙකෙහි දමා ඇති සමන්පිච්ච මල් මාලා සමහර අවස්ථාවල දී දළ ගමන් ගන්නා ඇතුන් දෙදෙනාගේ දළ දෙකෙහි ද පලඳවනු ලැබේ.

**3.7 රූපය** සමන් පිච්ච මල් මාලා



### 3.2.7. ගෙජ්ජි හෙවත් පාද සලං

සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියාගේ හා දැළ ගමන් ගන්නා ඇතුන් දෙදෙනාගේ ද පාදවල දමා ඇති ගෙජ්ජි හෙවත් පාද සලං අතීතයේ දී මංගල හස්තියාගේ ඇඳුම් කට්ටලයට පමණක් සීමා වූ කොටසක් විය.

**3.8 රූපය** පෙරහැර කරඬුව වැඩම කරවන මංගල හස්තියාට සහ දැලේ ඇතුන් දෙදෙනාට පලඳවන පා සලඹ




### 3.3. භාවිත අමුද්‍රව්‍ය

ඕනෑම දෙයක ප්‍රමිතිය තීරණය වන්නේ ඒ සඳහා භාවිත කරන අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය මතය. ඒ අනුව මෙසේ පෙරහැර සඳහා සම්බන්ධ වන අලි ඇතුන්ට නිර්මාණය කරන ඇඳුම් කට්ටලවලට වුවද යොදා ගන්නේ හොඳ ම අමුද්‍රව්‍යයන්ය. විශේෂයෙන් ම මාළිගාවේ හස්ති වස්ත්‍රයක් සාමාන්‍යයෙන් වසර කිහිපයක් මාරුවෙන් මාරුවට භාවිත කරන අතර වෙනත් පෙරහැර මංගල්‍යයන් සඳහා ලබා දෙන අවස්ථා ද ඇත. එබැවින් නිර්මාණය කරන හස්ති වස්ත්‍රය කාලයක් භාවිතයට ගත හැකි ආකාරයේ උසස් තත්ත්වයකින් සකස් කිරීම අනිවාර්ය වේ. අතීතයේ පෙරහැර සඳහා සකස් කළ අලින්ගේ ඇඳුමක් වසර දහයක් පමණ භාවිතයට ගෙන ඇත. එලෙස දිගු කාලයක් ඒවා භාවිතයට ගැනීමේ හැකියාව ලැබී ඇත්තේ එතරම් උසස් තත්ත්වයේ රෙදි සහ සෙසු අමුද්‍රව්‍ය යොදා නිර්මාණය කොට තිබූ බැවිනි.

සාමාන්‍යයෙන් හස්ති වස්ත්‍රයක් නිර්මාණය කරන්නේ ස්ථර තුනකින් හෝ හතරකිනි. එය ඒ ඒ නිර්මාණ ශිල්පියාට සාපේක්ෂ වේ. නුවර පෙරහැර සඳහා කාලයක පටන් හස්ති වස්ත්‍ර නිර්මාණය කරන

තදානි මහතාට අනුව එක් ඇඳුමක් සඳහා රෙදි මීටර් 88ක් අවශ්‍ය වේ.[83] ඔහු ඇඳුම සකස් කරන්නේ ස්ථර 4කටය. එම නිසා එක් ස්ථරයක් සඳහා රෙදි මීටර් 22 බැගින් හතරක් අවශ්‍ය වෙයි. වෙල්වට් රෙදි යාර 22ක්, පෑඩ් කිරීම සඳහා වූ ෆෝම් රබර් මීටර් 22ක් සහ තවත් තට්ටු දෙකක් සඳහා අවශ්‍ය රෙදි මීටර් 44ක් ඊට ඇතුළත්ය.

ඇඳුම මසා අවසානයේ එය හැඩ කිරීමට ස්වීක්වින්ස්, බීඩ්ස්, පබළු සහ නොයෙක් ගල් වර්ග යොදා ගනී. මේවාට අමතරව ඒ ඒ ශිල්පියා අනුවත්, මෝස්තරය අනුවත් යොදා ගන්නා අමුද්‍රව්‍යවල ද වෙනස්කම් පවතී. සාමාන්‍යයෙන් එක් ඇඳුමක් සඳහා මෝස්තර දැමීමට ස්වීක්වින්ස් කිලෝ දෙකක් පමණ අවශ්‍ය වේ. බීඩ්ස් නම් කිලෝ හතරක් ප්‍රමාණවත්ය. මේ සියලු දේ එක්ව ගෙන බැලීමේ දී එක් හස්ති වස්ත්‍රයක් සඳහා සාමාන්‍යයෙන් රුපියල් ලක්ෂ දෙකක පමණ මුදලක් වැයවේ.[84]

මුල් කාලීන හස්ති වස්ත්‍රය අද මෙන් අලියාගේ ශරීරය මුළුමනින් ම ආවරණය වූ ඇඳුමක් නොවේ. එහි ඇත් හැට්ටය සහ නෙත්තිමාලය ප්‍රමාණයෙන් කුඩා සහ කෙටි බවින් යුක්තය. ඇතැම් අවස්ථාවල හස්ති වස්ත්‍රයට සම්බන්ධ වන උරමාලය හෝ ගෙජ්ජි ද දැකිය නොහැකිය. බෙල්ලෙන් පහළ ඉදිරිපස කකුල් දෙක අතර කොටස ආවරණය වන පරිදි රෙදි කෑල්ලක් දමා ඇත. එහි මෝස්තරවලින් අලංකාර කිරීමක් හෝ වැඩ දැමීමක් නැත. අතීත හස්ති වස්ත්‍රය සැරසීමට සඳහා ස්වීක්වින්ස්, බීඩ්ස් හා පබළු වැනි දෑ යොදා ගත් බවක් නොපෙනේ. ඒ වෙනුවට **බොක්සාලේ** නමින් හැඳින්වෙන ඇලුමිනියම් කෝප්පවලින් සාදාගත් රවුම් හැඩැති සැරසිල්ලක් භාවිත විය. එය තාක්ෂණික භාවිතයකින් තොරව නිර්මාණ ශිල්පියාගේ අතින් ම නිර්මාණය වූවකි. පසුකාලීනව විවිධ හැඩ සහිත රෙදි වර්ග උපයෝගී කරගෙන හස්ති වස්ත්‍ර සකස් වුවත් ඒවායේ වර්ණවත් බවක් හෝ ආකර්ෂණයක් ද තිබුණේ නැත. නමුත් ශිල්පියාගේ නිර්මාණාත්මක බව, දක්ෂතාවය, අත්හදා බැලීම් සහ නව ක්‍රමෝපායන් භාවිතයට නැඹුරු වීම වැනි කාරණා නිසා කාලානුරූපීව වෙනස් වෙමින්

[83] තදානි, 2020.04.23

[84] අසංග, 2022.05.02

වර්තමානය වන විට එය වඩාත් දියුණු ක්‍රම ඔස්සේ වර්ධනය වූ බව පෙනේ.[85]

### 3.4. මිනුම් ලබා ගැනීම

ඇඳුමක් නිර්මාණය කිරීමේදී එය අඳින පුද්ගලයාට අපහසුවක් නොවන ආකාරයට සකස් කිරීම නිර්මාණ ශිල්පියා සතු කාර්යයකි. සේවාලාභියා තෘප්තිමත් වන්නේ එවිටයි. අලි ඇතුන් සඳහා නිර්මාණය කරන ඇඳුමක වුව ද, ඒ ඒ හස්තියාට ගැළපෙන පරිදි සකස් කළ යුතුය. නැතහොත් ගැටලු රැසක් ඇති වීමට ඉඩ තිබේ. එබැවින් නිවැරදි මිනුමක් ලබා ගැනීම ඇඳුම් නිර්මාණයේ දී අත්‍යවශ්‍ය කාරණයකි.

සාමාන්‍යයෙන් ඇඳුමක් සකස් කිරීමේ දී අදාළ පුද්ගලයාගේ ශරීරයේ ප්‍රමාණය මිනුම් පටියක ආධාරයෙන් අවශ්‍ය පරිදි ලබා ගැනීමක් සිදු කළ ද දැවැන්ත ශරීරයක් හිමි සද්දන්ත කුලයේ අලි ඇතුන්ගේ ශරීරවල මිම්ම ලබා ගැනීමට මිනුම් පටි භාවිත කිරීම අපහසුය. ඊට එක් හේතුවක් නම්, අලි ඇතුන්ගේ ශරීරය සාමාන්‍ය මනුෂ්‍යයෙකුගේ ශරීරය මෙන් කිහිප ගුණයක් විශාල වීමයි. මිනුම් ලබා ගන්නා තුරු හස්තියා නිසොල්මන්ව තබා ගැනීමේ අසීරුතාව දෙවැන්නයි. අනෙක නම්, ඇත්ගොව්වන්ට සහ අලි හිමියන්ට මෙන් අලි ඇතුන් සෑම අයෙකුට ම හීලෑ නොවීමයි. මේ නිසා ඇඳුම් සකස් කිරීමට ශරීරයේ මිම්ම ලබා ගන්නා සාමාන්‍ය ක්‍රමවේදය අලි ඇතුන්ට වලංගු නොවේ. නමුත් හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පියා ඒ වෙනුවට අපූරු උපක්‍රමයක් යොදා ගනී. ඒ, ඇස් මට්ටමෙන් බලා මිනුම් ලබා ගැනීමයි. බැලූ බැල්මට එය විය නොහැකි යැයි සිතෙන තරමට සංකීර්ණ අසීරු කාර්යයකි. හස්තියෙකු දුටු පමණින් එම සත්ත්වයාගේ ඇඳුමේ ප්‍රමාණය නිවැරදිව තීරණය කිරීම සැබැවින් ම පුදුම සහගතය. නමුත් එහි මනා පළපුරුද්දක් ඇති අලි ඇතුන් ඇසුරේ කාලය ගත කරන අයෙකුට එය එතරම් අපහසු නැත. හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පියෙකු වූ තදානි මහතා පවසන්නේ, ඇතෙකු දුටු විට ඒ සතාගේ ඇඳුමේ ප්‍රමාණය නිවැරදිව තීරණය කිරීමට තමාට

---

[85] අසංග, 2022.05.02

හැකියාවක් ඇති බවයි.[86] මෙහි වැදගත් ම කාරණය වන්නේ, එම මිනුම් ලබා ගන්නා ආකාරය කිසිවෙකුට ප්‍රකාශ නොකිරීමයි.

හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පී ළහිරු අසංග මහතා දක්වන ආකාරයට අලි ඇතුන්ගේ මිනුම් ලබා ගැනීම හස්තියාගෙන් හස්තියාට විශේෂයෙන් වෙනස් වන්නේ නැත. එහි ඇත්තේ පොදු මිම්මකි. වෙනසක් වේ නම්, ඒ අලි ඇතුන්ගේ උස ප්‍රමාණය විවිධ වන නිසාය. නුවර පෙරහැරේ කරඬුව වැඩම කරවන ඇතෙක් සාමාන්‍යයෙන් අඩි 10ක් පමණ උසය. එවැනි ඇතුන් 9 දෙනෙක් පෙරහැරෙහි ගමන් කරති. ඔවුන් පෙරහැරෙහි ගමන් ගන්නා ප්‍රධාන දළ ඇතුන්ය. උසින් බොහෝ විට එක හා සමාන වන මොවුන්ගේ ඇඳුම නිර්මාණය කරන්නේ එක ම ප්‍රමාණයකටයි. පෙරහැරේ ගමන් කරන අනෙක් ඇතුන්ට සකස් කරන ඇඳුම ඒ ඒ අලියාගේ ප්‍රමාණය හා උස අනුව යම් යම් වෙස්කම් පවතී. විශේෂයෙන් ම අලි ඇතුන් සමඟ පෙරහැරට සහභාගී වන කුඩා ඇත් පැටවුන් ද සිටියි. එවිට ඔවුන්ගේ ඇඳුමේ ප්‍රමාණය සෙසු අයට වඩා වෙනස් වේ.[87]

### 3.5. නිර්මාණකරණය

ඕනෑම ඇඳුමක් මැසීමට පෙර ඒ සඳහා දළ සැකැස්මක් සාදා ගත යුතුය. ඇඳුම මැසීමට අවශ්‍ය කොටස් කපා වෙන්කර ගැනීමෙන් හා පිළිවෙළකට සකස් කිරීමෙන් පසු මැසීමේ කටයුතු ආරම්භ වෙයි. එහිදී හස්ති වස්ත්‍රයක සැලසුම් ශිල්පියා එය මැසීමේ කාර්යයට සම්බන්ධ නොවේ. ඒ සඳහා වෙන ම පිරිසක් ඇත. ඔහුගේ කාර්යය වන්නේ, ඇඳුම නිර්මාණය විය යුතු ආකාරයත්, ඒ සඳහා යොදා ගන්නා සැරසිලි මෝස්තරත් සහිත ඇඳුමේ සැකිල්ල සකස් කිරීමයි. එය අනුගමනය කරමින් නියමිත මිනුම්වලට අනුව කපා වෙන්කර ගත් රෙදි කැබලි එකින් එක ගෙන මැසීම, ඊට අදාළ ශිල්පියා විසින් සිදුකරනු ලැබේ.

නුවර පෙරහැර සඳහා නිමවන හස්ති වස්ත්‍ර, මංගල හස්තියාගේ

[86] තදානි, 2020.04.23

[87] අසංග, 2022.05.02

ඇඳුම සහ සෙසු හස්තීන්ගේ ඇඳුම් වශයෙන් ප්‍රධාන කාණ්ඩ දෙකකි. ඒ අතරින් මංගල හස්තියා අඳින ඇඳුම් කට්ටලයට සමාන ඇඳුම් දෙකක් ඔහුට දෑළේ ගමන් කරන ඇතුන් දෙදෙනා වෙනුවෙන් ද නිර්මාණය වෙයි.[88] ඒවායේ එන මෝස්තර හා වර්ණ යෙදීම් බොහෝ දුරට සමාන නමුත් දෑළේ දෙදෙනාට වඩා වැඩි අවධානයක් පෙරහැර කරඬුව රැගෙන යන ඇතා වෙත ලැබෙන පරිදි එම ඇඳුම නිර්මාණය කිරීමට නිර්මාණ ශිල්පීහු වගබලා ගනිති. හස්ති වස්ත්‍රයට අයත් එක් එක් කොටස සකස් කරන ආකාරය ද විවිධ අවස්ථාවල දී ඒ ඒ ශිල්පියා අනුව වෙනස් වෙයි.

**3.5.1. නෙත්තිමාලය**

නෙත්තිමාලය සකස් කරන්නේ අලියාගේ හිසේ හැඩයට සරිලන ආකාරයෙනි. එහිදී කුඹුතල, ඇස් සහ සොඬ යන අංග නිවැරදිව නිර්මාණය කිරීම වැදගත්ය. නෙත්තිමාලය සකස් කිරීමේ දී වැදගත්ම කොටස වන්නේ අලියාගේ ඇසට සම්බන්ධ වන කොටසයි. හස්තියාගෙන් හස්තියාට වෙන වෙන ම මිනුම් ලබා ගැනීමක් නොකරන නිසා ඇඳුමේ විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු අංග කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට නිර්මාණ ශිල්පියාට සිදුවේ. නෙත්තිමාලයේ ඇස පිහිටන ප්‍රදේශය අලියාගේ ඇසට සම්බන්ධ වන විට සතාට අපහසුවක් නොදැනිය යුතුය. විශේෂයෙන් ම ඇස් දෙක අතර ප්‍රමාණය, ඇස සම්බන්ධ විය යුතු ස්ථානය වැනි කරුණු නිවැරදිව පැවතීම වඩා වැදගත්ය. ඇසෙහි පිහිටීම යම් පමණකින් හෝ වෙනස් වුවහොත් සම්පූර්ණ ඇඳුම ම අපතේ දැමීමට සිදුවේ. එය විශාල අපරාධයකි. අනෙක් අතින් එය අලියාට ද අපහසුතාවකි.

**3.5.2. කන්පෙති**

නෙත්තිමාලයට පසුව හස්ති වස්ත්‍රයට සම්බන්ධ වන්නේ කන්පෙතියි. කන්පෙතිවල හැඩය සඳහා ඇතැම් නිර්මාණ ශිල්පීන් සම්පූර්ණ වෘත්තයකින් කපාගත් අර්ධ කවාකාර කොටස් දෙකක් යොදා ගනී. නමුත් කෝට්ටේ පෙරහැරෙහි හස්ති වස්ත්‍ර නිර්මාණය කරන ශිල්පීන් අලියාගේ කනේ හැඩය ම ගෙන කන්පෙති නිර්මාණය කරයි. අඩකව

[88] අසංග, 2022.05.02

දෙකකට වඩා කනෙහිම හැඩය ගත් කන්පෙත්ත වැඩි ලස්සනක් ගෙනේ. එය අලියාට ද පහසුවකි. පෙරහැරේ ගමන් ගන්නා විට අලි ඇතුන් නිරන්තරයෙන් කන් ගැසීම දක්නට ලැබෙයි. ඒ, අලියාගේ ශරීරයේ උෂ්ණත්වය වැඩි නිසා එය පිට කිරීමටය. එසේ ම අලි ඇතුන්ගේ රුධිර වාහිනී පැහැදිලිව දක්නට ලැබෙන්නේත් කන්පෙතිවලයි. එබැවින් අලියාගේ කණට නිරන්තරයෙන් සිසිලස අවශ්‍ය වේ. මේ බව හොඳින් දන්නා අලි ඇඳුම් නිර්මාණ ශිල්පීන් අලි ඇඳුමේ කන්පෙති සකස් කිරීමේ දී කන්පෙත්තට පිටුපසින් කුඩා කුඩා වා කවුළු කිහිපයක් නිර්මාණය කිරීමට වගබලා ගනී. එයින් අලියාට අපහසුවකින් තොරව සිය ශරීරයේ උෂ්ණත්වය පාලනය කර ගැනීමට හැකියාවක් ලැබේ.

### 3.5.3. ඇත් හැට්ටය

නුවර පෙරහැරේ අලි ඇතුන්ගේ ඇත් හැට්ටය නැතහොත් පිට රෙද්ද අනෙක් පෙරහැරවල ඒවාට වඩා තරමක් විශේෂ වේ. ඇත් හැට්ටය මගින් අලියාගේ කඳ කොටස දෙපසින් ආවරණය වීම සහ පිටුපස කොටස ආවරණය වීම දක්නට ලැබෙන්නේ නුවර පෙරහැරේ පමණි. පිටුපස ආවරණය වන පරිදි හස්ති වස්ත්‍ර මැසීම ආරම්භ කළේ තදානි මහතාය. විශේෂයෙන් ම පෙරහැර කරඬුව වැඩම කරවන අවස්ථාවකට නිමවන ඇඳුමක් නම් ඇත් හැට්ටයේ පලු දෙක එකට තබා මැසීමක් සිදු නොවේ. කරඬුව ගෙන යන ඇතාට ඇත් හැට්ටය අන්දවන්නේ වතපුටුව බැඳීමෙන් පසුය. එම නිසා එවැනි ඇඳුමක ඇත් හැට්ටය වතපුටුවට උඩින් දමා ගැටගැසීමට හැකි වන පරිදි සකස් වෙයි. නමුත් පෙරහැර කරඬුව රැගෙන යාමට භාවිත නොකරන සෙසු ඇඳුම්වල ඇත් හැට්ටය සකස් කර ඇත්තේ පලු දෙක එකට එක් කර මැසීමෙනි.

පෙරහැර කරඬුව වැඩම කරවන ඇතා සහ ඔහුට දැළේ ගමන් කරන ඇතුන් දෙදෙනාට පමණක් ලැබෙන, නමුත් පෙරහැරේ යන සෙසු අලි ඇතුන්ගේ ඇඳුමට අයත් නොවන උරමාලය නම් කොටසක් වෙයි. සාමාන්‍යයෙන් උරමාලයකින් සිදු වන්නේ ඇතාගේ බෙල්ලහි ඇති දම්වැල් සහ හස්ති වස්ත්‍රය අන්දවා එය ඇඟට සවි වන ආකාරයෙන් ගැටගසා ඇති පටි ආවරණය කිරීමයි. නමුත් එයින් ඊට වැඩි අලංකාරයක්

අලියාගේ ඇඳුමට එක් කෙරේ.

### 3.6. වැඩ දැමීම

හස්ති වස්ත්‍රවලට වැඩ දැමීම හෙවත් මෝස්තර රටා නිර්මාණය කිරීම ද වෙන ම කාර්යයකි. ස්වීක්වින්ස්, පබලු, ගල් වැනි ද්‍රව්‍ය යොදා ගෙන සියුම් හැඩ රටා ගොඩනැගීමට තරම් සංයමයක් නිර්මාණ ශිල්පියා සතු විය යුතුය. නුවර පෙරහැරේ හස්ති වස්ත්‍ර නිර්මාණය කරන තදානි මහතා මෝස්තර රටා ගොඩනගන්නේ ස්වීක්වින්ස් එකිනෙක තබා අතින් මැසීමෙනි. ගල් හෝ පබලු වැනි යමක් භාවිත කරන්නේ නම් සියතින් ම ඉතා සීරුවට එකින් එක අමුණයි. ඇතැම් නිර්මාණ ශිල්පීහු මේවා මහන මැෂිමෙහි මසා එයින් මැසිය නොහැකි සේ ඉතිරි වන කොටස අතින් නිර්මාණය කරති. නමුත් බොහෝ විට හස්ති වස්ත්‍ර සඳහා වැඩ දැමීම සිදු වන්නේ අතිනි. තෝරා ගන්නා මෝස්තරය හෝ රටාව අනුව ඇඳුමකට වැඩ දැමීමට යන කාලයෙහි ද අඩු වැඩි වශයෙන් වෙනස්කම් සිදුවේ.[89]

### 3.7. වර්ණ සංයෝජනය

අලි ඇතුන්ගේ ඇඳුම් පිළිබඳ සංකල්පය කරලියට එන්නේ පෙරහැර සංස්කෘතියෙනි. අලංකාර වස්ත්‍රයෙන් සරසා තේජවන්ත ගමනින් එන සද්දන්ත කුලයේ හැඩකාරයන් වෙත කාගේත් අවධානය යොමු වන්නේ එම නිසාය. එම ඇඳුම් අලංකාරය. විචිත්‍රවත් ය. පෙරහැරේ අලංකාරය ඇත්තේ එහිය. නොයෙක් වර්ණයෙන් හැඩයෙන් හා මෝස්තරයෙන් හැඩ කරන ලද අලි ඇතුන්ගේ ඇඳුම පෙරහැර මංගල්‍යයට එක් කරන්නේ අමුතු ම ආලෝකයකි. සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තිරාජයාගේ සිට පෙරහැරෙහි ගමන් ගන්නා සෙසු සැම හස්තියෙකුගේ ම ඇඳුම සකස් කිරීමේ දී තෝරා ගන්නා වර්ණ පිළිබඳව නිර්මාණ ශිල්පියා විශේෂාවධානයක් යොමු කර ඇති බව පෙනේ. විශේෂයෙන් ම පෙරහැර සම්බන්ධයෙන් මාළිගාව සතු සිරිත් විරිත් හා සම්ප්‍රදායන් බොහෝවකි. මෙරට පැවැත්වෙන සෙසු පෙරහැර

[89] අසංග, 2022.05.02

මංගල්‍යයන් සහ මහනුවර ඇසළ පෙරහැර එක්ව ගත් විට එම වෙනස වඩාත් පැහැදිලිව පෙනේ. හස්ති වස්ත්‍රය ගැන වුවද වර්ණ භාවිතය සම්බන්ධයෙන් යම් යම් කාරණා දැකිය හැකි වන්නේ එම නිසාය.

### 3.7.1. රන්දෝලි පෙරහැර

දළඳා පෙරහැරේ වර්ණවත් ම පෙරහැර වන්නේ රන්දෝලි පෙරහැරයි. මහනුවර ඇසළ පෙරහැර මංගල්‍යයේ අවසන් පෙරහැර 5 රන්දෝලි පෙරහැර වශයෙන් ගැනේ. එයින් ද අවසන් මහා රන්දෝලිය වඩා වර්ණවත්ය. ඒ සඳහා පෙරහැරෙහි ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම් පැලඳුම්වල වර්ණය ද ප්‍රබල බලපෑමක් කරයි. රන්දෝලි පෙරහැර සඳහා අලි ඇතුන්ට ලැබෙන්නේ වර්ණවත් ඇඳුම් කට්ටලයකි. ඒවා තදරතු රතු, රත්රන්, නිල්, කහ සහ දම් වැනි තද පැහැයන්ගෙන් නිමවා තිබේ.

**3.9 රූපය** මෙරූන් පැහැති වස්ත්‍රයකින් සැරසී අවසන් මහා රන්දෝලි පෙරහැරේ සධාතුක කරඬුව වැඩම කරවන නැදුන්ගමුවේ රාජා හස්තියා සමඟ ඔහුට දැලේ ගමන් කරන කතරගම වාසනා හස්තියා සහ ශ්‍රී දළඳා මාළිගාවේ ඉන්දි රාජා හස්තියා.



### 3.7.2. කුඹල් පෙරහැර

මහනුවර ඇසළ පෙරහැර දින දහයක් මුළුල්ලේ පැවැත්වෙන

විශාල බෞද්ධ මංගල්‍යයකි. එය කුඹල් පෙරහැර 5ක් සහ රන්දෝලි පෙරහැර 5ක් වශයෙන් බෙදේ. ඊට අමතරව දවල් පෙරහැර ද පැවැත්වේ. දළදා පෙරහැර සෙසු පෙරහැර මංගල්‍යයන්ට වඩා වෙනස් වන එක් කරුණක් වන්නේ කුඹල් පෙරහැර සඳහා අලි ඇතුන්ට අන්දවන ඇඳුම් කට්ටලය සුදු පැහැය හෝ ඇත් දළ පැහැය ගැනීමයි. පෙරහැර කරඬුව වැඩම කරවන මංගල හස්තියා පමණක් නොව පෙරහැරට සම්බන්ධ වන සෙසු සියලු හසතීන්ගේ ඇඳුම් ද එදිනට පමණක් ධවල වර්ණයක් ගනී. එම ඇඳුම්වලට මෝස්තර හා රටා එකතු කිරීමේ දී විවිධ වර්ණ භාවිත කරනු පෙනේ. නමුත් ඒවා අඩු වැඩි වශයෙන් ගළපා එක් කරන ලද සිසිල් වර්ණය.

**3.7.3. දේවාල පෙරහැර**

ශ්‍රී දළදා මාළිගාවේ වාර්ෂික ඇසළ මහා පෙරහැරට සහභාගි වන අලි ඇතුන් ප්‍රමාණය සියයකට අධිකය. ඔවුන් අතරින් ප්‍රධාන දළ ඇතුන් නව දෙනා හැරුණු කොට අන් සියලු හස්තීන් දේවාලය පෙරහැරේ සහ මහ පෙරහැරෙහි සෙසු ස්ථාන සඳහා බෙදී වෙන් වෙයි. ඒ අනුව ඒ ඒ හස්තියාට අන්දවන ඇඳුමේ වර්ණය ද වෙනස් වේ. මෙම වර්ණ භේදය බලපාන්නේ සතර මහා දේවාලයවල පෙරහැරට පමණි. ඒ අනුව,

- **නාථ දේවාලය** - කහ වර්ණය
- **විෂ්ණු දේවාලය** - නිල් වර්ණය
- **කතරගම දේවාලය** - රතු පැහැය
- **පත්තිනි දේවාලය** - කහ සහ මෙරූන් වර්ණය

වශයෙන් වර්ණ විවිධත්වයක් දැකිය හැකිය. සතර මහා දේවාලය පෙරහැරේ ගමන් ගන්නා අලි ඇතුන් අඳිනු ලබන ඇඳුම පසු පෙරහැරකදී වෙනත් හස්තියෙකු සැරසීම සඳහා ද භාවිත කරයි. වැදගත් වන්නේ, ඒ ඒ දේවාලය සඳහා අනන්‍ය වූ වර්ණයෙන් යුතුව හස්ති වස්ත්‍රය නිර්මාණය කිරීමයි. ඒවායේ යොදන මෝස්තර රටාත් දේවාලය අනුව වෙනස් වන නමුත් පොදුවේ යොදා ගන්නා අවස්ථා ද වෙයි.[90]

[90] අසංග, 2022.05.02

මෙම ප්‍රධාන පෙරහැර හැර වීදි සංචාරය කරන දවල් පෙරහැර සඳහා රන්දෝලියේ මෙන් විචිත්‍රවත් වර්ණ සහිත ඇඳුම් ආයිත්තම් අලි ඇතුන්ට හිමිවේ. පෙරහැර මංගල්‍ය ආරම්භ කිරීමට පළමුව සිදු වන කප් සිටුවීම හා අවසානයේ සිදු කරන දිය කැපීමේ චාරිත්‍රය සඳහාත් අලි ඇතුන් පිරිවරාගත් මහා පෙරහැරක් වීදි සංචාරය කරයි. එහිදී අලි ඇතුන්ට අන්දවන ඇඳුමේ අමුතු විශේෂත්වයක් නොවන නමුත් වර්ණ අතින් ගත් කල රන්දෝලියේ වර්ණවලට සාම්‍යත්වයක් දක්වයි.

### 3.8. සැරසිලි මෝස්තර

සෑම වසරක් පාසා ම මහනුවර ඇසළ මහා පෙරහැර මංගල්‍යයට සහභාගී වන අලි ඇතුන් වෙනුවෙන් නිර්මාණය කරන ලද ඇඳුම් කට්ටල විශාල සංඛ්‍යාවක් මාළිගයට ලැබේ. ඒවායේ වර්ණය කිහිපයකට සීමා වූ නමුත් වැඩ දැමීමේදී යොදා ගන්නා මෝස්තර රටා සහ හැඩතල එකිනෙකින් සපුරා වෙනස් වෙයි. භාවිත රටාව හෝ මෝස්තරය එකක් වුවත් රේඛා සහ හැඩතල ඉස්මතු කිරීමත්, උචිත පරිදි තෝරා ගැනීමත්, ගැළපීමත් යන කාරණා අනුව ප්‍රබල වෙනස්කම් දැකිය හැකිය. ඒ සඳහා ඒ ඒ නිර්මාණ ශිල්පියාගේ හැකියාව ද ඍජු බලපෑමක් ඇති කරයි.

ඇසළ පෙරහැර මංගල්‍යයේ අලි ඇතුන් වෙනුවෙන් නිර්මාණය වන ඇඳුම් ආයිත්තම් සඳහා බහුලව යොදා ගන්නේ පාරම්පරික සිංහල සැරසිලි මෝස්තරයි. ඒ අතරින් මහනුවර කාලයේ කැටයම් සිතුවම් ආදී කලා කෘතීන් අතර ප්‍රචලිතව පැවති මෝස්තර රටා සහ සැරසිලිවලට හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීහු වැඩි අවධානයක් යොමු කරති. ඊට හේතුව මහනුවර ඇසළ පෙරහැර පූර්ණ වශයෙන් ම උඩරට සම්ප්‍රදාය හා සංස්කෘතිය අනුව ගොඩනැගී තිබීමය. පෙරහැරට සම්බන්ධ වන නැටුම් කණ්ඩායම් පවා උඩරට නැටුම් සම්ප්‍රදායට අයත් ඒවා පමණි. එබැවින් හස්ති වස්ත්‍රයට පමණක් වෙනත් සම්ප්‍රදායක ආභාසය ලැබුණා යැයි සිතීම අපහසුය.


මාළිගාවේ අලි ඇතුන් වෙනුවෙන් සකස් වන ඇඳුම් කට්ටලය සඳහා යොදා ගන්නා සෑම මෝස්තරයක් ම කිසියම් අර්ථයක් සහිතව භාවිතයට ගැනීම ද විශේෂත්වයකි. බෞද්ධ දර්ශනය හා බෞද්ධ

සංස්කෘතිය, කලාව සමඟ දක්වන සමීප සබඳතාවය ඊට හේතුවයි. මෙම මෝස්තර රටා සහ හැඩ ගෞරවය, සෞභාග්‍ය, සශ්‍රීකත්වය හා පවිත්‍රත්වය සංකේතවත් කරයි. පෙරහැර යනු වර්ෂාව බලාපොරොත්තුවෙන් පවත්වන එක්තරා අභිචාර විධියකි. පූජා කර්මයකි. නමුත් එහි ප්‍රධාන අරමුණ දළදා වහන්සේ උදෙසා පූජෝපහාර පැවැත්වීමයි. එබැවින් පෙරහැරෙහි ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම් ආයිත්තම් හැඩකිරීමට සඳහා යොදා ගන්නා මොස්තර රටාවේ සිට සෑම දෙයක් ම පාරිශුද්ධ විය යුතුය. අර්ථාන්විත විය යුතුය. හස්ති වස්ත්‍ර සැකසීමේදී අදාළ කාර්යයේ නියුතු නිර්මාණ ශිල්පීන් අවශ්‍ය දේ කුමක්ද යන්න නිවැරදිව තෝරා ගෙන වැඩ කරන්නේ එම නිසාය. ඒ ආකාරයට හස්ති වස්ත්‍ර වැඩ දමා අලංකාර කිරීමට ඔවුන් විසින් යොදා ගන්නා ලද මෝස්තර රටා කිහිපයකි.

### 3.8.1. නෙළුම් මල

පවිත්‍රතාවය සංකේතවත් කරන නෙළුම් මල, බෞද්ධ කලා නිර්මාණවලදී පූජනීයත්වය නිරූපණය කිරීමට යොදා ගැනුණි. විශේෂයෙන් ම මහනුවර යුගයේදී සිංහල සැරසිලි මෝස්තර වඩා ජනප්‍රිය වීම නිසා එහි භාවිතය ද වැඩි විය. පෙරහැරේ ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම් පැලඳුම්වලට නෙළුම් මල එකතු වන්නේ ඒ



ආකාරයෙනි. නෙළුම් මල සිංහල සැරසිල්ලක් වශයෙන් යොදා ගැනීමේදී නිර්මාණ ශිල්පියා එහි මූලික ස්වරූපය නොවෙනස් වන ආකාරයට තමාට රුචි පරිදි විවිධ වෙනස්කම් සිදු කරයි. එම විවිධත්වය විහාරස්ථානයක අඳින ලද සිතුවමකදී මෙන්ම පෙරහැරේ ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම් පැළඳුම්වලදී ද පැහැදිලිව දක්නට ලැබේ. දළදා පෙරහැරෙහි නාථ, විෂ්ණු හා පත්තිනි යන දේවාලයවල පෙරහැරවල දේව ආභරණ වැඩම කරවන හස්තියා සහ සෙසු හස්තීන්ගේ ඇඳුම හැඩ කිරීමට බහුලව යොදා ගැනෙන්නේ ද නෙළුම් මලයි. එය හැරුණු කොට මහ පෙරහැරෙහි ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම්වලත්, විශේෂයෙන් ම පෙරහැර කරඬුව වැඩම කරවන මංගල හස්තියා සහ දෑළේ ඇතුන් දෙදෙනාගේ ඇඳුම් කට්ටලයත් බොහෝ විට හැඩවන්නේ නෙළුම් මල් මෝස්තරයෙනි. අලි ඇඳුමේ නෙත්තිමාලය, ඇත් හැට්ටය හා කන්පෙති සැරසීම සඳහා කුඩා සහ ප්‍රමාණයෙන් විශාල නෙළුම් මල් යොදා ගනී. ඇත් හැට්ටය සඳහා කුමන මෝස්තරයක් භාවිත කළ ද කන්පෙති සැරසීමට සෑම විට ම පාහේ මෙම රූපය යොදයි.

**3.10 රූපය** නෙළුම් මල් මෝස්තරය සහිත හස්ති වස්ත්‍රයක්

### 3.8.2. කඩුපුල් මල

සිව් මහා දේවාලයවල පෙරහැරට සම්බන්ධ වන හස්තීන්ගේ හැර දළදා පෙරහැරෙහි ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම්වල එන සැරසිලි අතර දක්නට ලැබෙන කඩුපුල් මල සිංහල සංස්කෘතියේදී නා ලොවට අයත් පුෂ්පයක් ලෙස සැලකේ. කහ, රතු හා කළු වර්ණයෙන් අලංකාර ලෙස වර්ණගන්වා ඇති මෙය නිර්මාණකරණයේදී හිස්තැන් පිරවීම සඳහා භාවිත කර තිබේ. හස්ති වස්ත්‍රවල එක් අංගයක් වන ඇත් හැට්ටය බොහෝ විට අලංකාර වන්නේ කඩුපුල් මලෙනි.

**3.11 රූපය** කඩුපුල් මල් මෝස්තරය සහිත හස්ති වස්ත්‍රයක්






### 3.8.3. පිච්ච මල

මෙය ස්වාභාවික පිච්ච මලේ හැඩය ගෙන නිර්මාණය කරන ලද සිංහල සැරසිලි මෝස්තරයකි. උතුම් මලක් ලෙස පිළිගැනෙන පිච්ච මල බහුලව යොදා ගන්නේ දේව රූපවල පසුබිම සැරසීම සඳහාය. මහනුවර ඇසළ පෙරහැරේ අලි ඇතුන්ගේ ඇඳුමෙහි හැට්ටය සඳහා යොදා ගන්නා මෙම රූපය එහි සතර පැත්තෙහි ම රෙද්ද වටා දිවෙන බෝඩරයක් මෙන් යොදයි. තනි තනිව යෙදෙන අවස්ථා ද ඇත.









**3.12 රූපය** පිච්ච මල් මෝස්තරය සහිත හස්ති වස්ත්‍රයක්

### 3.8.4. බිනර මල

සම්මත සැරසිලි මෝස්තරයක් ලෙස සැලකෙන බිනර මල පෙති හතරකින් යුක්තය. මලේ මැද කොටස කවාකාරය. මල් පෙති නෙළුම් මලේ පෙතිවලට සමාන වේ. විහාර කැටයම් සහ විහාරයවල වියන් සැරසීමට යොදාගත් සැරසිලි මෝස්තරයක් වූ මෙය මහනුවර යුගයේ දැකිය හැකි සිංහල සැරසිලි මෝස්තර අතර සුලබ වෙයි. සෙසු මෝස්තර නිර්මාණ හා හැඩතල මෙන් ම බිනර මලත් දළදා පෙරහැරෙහි ගමන්



ගන්නා අලි ඇතුන්ගේ ඇඳුම් ආයිත්තම් සැරසීම සඳහා බහුලව යොදා

ගනී. විශේෂයෙන් ම හැට්ටය, නෙත්තිමාලය හා ඇතැම් විට කන්පෙතිවල ද මෙම රූප දැකිය හැකිය.

**3.13 රූපය** බිනර මල් මෝස්තරය සහිත හස්ති වස්ත්‍රයක්




### 3.8.5. හංස පූට්ටුව

හින්දු ආගමේ ශුද්ධ ලකුණ සහ ස්වර්ග පක්ෂියා වන්නේ හංසයාය. හංසයා සුබ ලකුණක් ලෙස ද ඉසුරු ගෙනෙන වස්තුවක් ලෙස ද සැලකේ. අයෙක් හස්ති වස්ත්‍රවල ඇත් හැට්ටය හෙවත් පිට රෙද්ද අලංකාර කිරීමේදී තරමක් විශාල හංස පූට්ටුවක් මධ්‍යයේ සිටින පරිදි වෙනත් හැඩ සහ මෝස්තරවලින් ඉතිරිය හැඩ කරති. එය වෙනත් කෙනෙකු යොදා ගනු ලබන්නේ කුඩා කුඩා හංස පූට්ටු කිහිපයක් එක්තරා රටාවකට ස්ථානගත කිරීමෙනි. නෙත්තිමාලය අලංකාර කිරීමේදී ද මෙය දැකිය හැකිය.

**3.14 රූපය** හංස පූට්ටුව සහිත හස්ති වස්ත්‍රයක්





**3.8.6. මොනරා**

සත්ත්ව ලෝකයේ හැඩකාර ම පිරිමි සතා වශයෙන් ගැනෙන්නේ මොනරායි. ඊට බලපෑ ප්‍රධාන ම හේතුව නම් මොනරාට පමණක් ඇති අලංකාරවත් පිල් කළඹයි. සිංහල සැරසිල්ලක් වශයෙන් දක්නට නොලැබුණත් කලාකරුවන් සිය අභිමතය පිරිදි කලා නිර්මාණයන්හිදී මොනරා විවිධාකාරයෙන් යොදාගෙන ඇත. මෙම රූපය බහුලව දැකිය හැක්කේ කතරගම දෙවියන්ට සම්බන්ධ අවස්ථාවලය. මෙම සත්ත්වයා පෙරහැර අලි ඇතුන්ගේ ඇඳුමට එක් වන්නේ ද කතරගම දෙවියන් නිසාය. මහනුවර ඇසළ මහා පෙරහැරේ කතරගම දේවාලයේ පෙරහැරට සම්බන්ධ වන හස්තීන්ගේ ඇඳුම් හැඩවන්නේ මොනරාගෙනි. ඇතැම් විටක වෙනත් හස්තියෙකුගේ ඇඳුමක ද මෙම රූපය දැකගත හැකි නමුත් මොනරා වඩා සමීප ඇසුරක් දක්වන්නේ කතරගම දෙවියන් සමඟ වන නිසා කතරගම දේවාලය පෙරහැරෙහි ගමන් ගන්නා හස්තීන්ගේ වස්ත්‍රයේ මොස්තර හා හැඩතල අතර මොනරා අනිවාර්ය අංගයක් වෙයි.

**3.15 රූපය** මොනරාගේ රුව සහිතව නිමවන ලද කරඬුව වැඩම කරවන හස්ති වස්ත්‍රයක්



### 3.8.7. හේරුණ්ඩ පක්ෂියා

සිංහල සැරසිලි මෝස්තර අතර එන හේරුණ්ඩ පක්ෂියා යනු හිස් දෙකක් ඇති කල්පිත පක්ෂියෙකි. කන්ද උඩරට රාජධානියේ එක් එක් දිසාව නියෝජනය කිරීම සඳහා වන කොඩි අතර තුන් කෝරළයේ කොඩිය හේරුණ්ඩ පක්ෂියා නිරූපණය කරයි. මහනුවර යුගයේ කලාකරුවන් විසින් භාවිත කරන ලද මෝස්තර අතර බහුලව හමුවන මෙම රූපය දළදා පෙරහැරේ සිව් මහා දේවාලයවලින් විෂ්ණු දේවාලයේ පෙරහැරට සහභාගී වන අලි ඇතුන්ගේ ඇඳුමේ නෙත්තිමාලය හා ඇත් හැට්ටය යන අංගයන්හි බහුලව දැකිය හැකිය. එක් එක් දේවාලය වෙනුවෙන් වෙන් වූ මෝස්තර රටා අතර විෂ්ණු දේවාලය හේරුණ්ඩ පක්ෂියාගෙන් නිරූපණය කෙරෙන බව පෙනේ.

**3.16 රූපය** නෙත්තිමාලය සඳහා භේරුණ්ඩ පක්ෂියාගේ රුව සහිතව නිමවන ලද කරඬුව වැඩම කරවන හස්ති වස්ත්‍රයක්







### 3.8.9. ගජ සිංහ

ගජ සිංහ යනු හස්තියාගේ හිසත්, සිංහ ශරීරයත් ඇති මනඃකල්පිත රූපයකි. මහනුවර යුගයේ කැටයම් කලාව තුළ ප්‍රසිද්ධව පැවති මෙම රූපය පෙරහැර අලින්ගේ ඇඳුමට එකතු වන්නේ හස්ති වස්ත්‍රයේ ඇත් හැට්ටය ලෙස ගැනෙන කොටස සැරසීම සඳහා යොදන මෝස්තර රටාවක් ලෙසයි.

**3.17 රූපය**

ගජ සිංහ රූපය සහිත හස්ති වස්ත්‍රයක්






### 3.8.10. පලාපෙති

පලාපෙති යනු නෙළුම් මලින් ප්‍රභවය වූ සැරසිලි ක්‍රමයකි. එනම්, නෙළුම් පෙතිවලින් සමන්විත වූ වාටි මෝස්තරයකි. නැතහොත් ලීස්තරයකි. ඇඳුම් ආයිත්තම් සම්බන්ධයෙන් ගත්කළ සරම්, සාරි හා කමිස සඳහා වැඩි ඉල්ලුමක් ඇති මෙය මහනුවර ඇසළ පෙරහැරේ ගමන් ගන්නා සෑම හස්තියෙකුගේ ම පාහේ ඇඳුමේ ද දැකිය හැකිය. විශේෂයෙන් ම ඇත් හැට්ටයේ බෝඩරය සහ ඇතැම් විට ඇත් හැට්ටයේ ඇතුළත මෝස්තර ගොඩනැගීමට ද බහුලව භාවිත වන්නේ පලාපෙති රටාවයි. නෙත්තිමාලයේදී හස්තියාගේ ඇස් වටා සියුම් ලෙස හැඩදමා ඇත්තේ ද මෙම රටාවෙනි. වර්තමානය වන විට හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන් බොහෝ පිරිසක් මෙම මෝස්තර රටාව විවිධාකාරයෙන් වැඩි දියුණු කර නව රටා නිර්මාණය කරගෙන තිබේ. පලාපෙති රටාව, ලියපත සමඟ යොදා නිපදවාගෙන ඇති මෝස්තර රටාව එවැන්නකි.

**3.18 රූපය** ඇත් හැට්ටයේ වාටි මෝස්තරය සඳහා පලා පෙති යොදා ගත් අවස්ථාවක්.





### 3.8.11. ලියවැල

සිංහල සැරසිලි මෝස්තර අතර එන ලියවැල හෙවත් ලතාව දෙපසට කරකැවෙමින් යන අලංකාර මෝස්තරයකි. පෙරහැරට සම්බන්ධ වන හස්තීන්ගේ වස්ත්‍රාභරණ කට්ටලයේ යෙදෙන මෝස්තර රටා අතර බහුලව දැකිය හැකි මෙම රටාව හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන් අතර ජනප්‍රිය මෝස්තරයකි. හස්ති වස්ත්‍රයේ එක් අංගයක් වන උරමාලය හැඩ කිරීමට ඔවුන් සෑම විටම පාහේ ලියවැල් යොදා ගනී. පෙරහැරෙහි ගමන් ගන්නා අලි ඇතුන් අතරින් උරමාලය සහිත ඇඳුමක් හිමි වන්නේ පෙරහැර කරඬුව වැඩම කරවන මංගල හස්තියාට සහ දෑළ ඇතුන් දෙදෙනාට පමණි. නෙත්තිමාලයේ සොඬ කොටස ද බොහෝ විට ආවරණය වන්නේ අලංකාර ලියවැල් මෝස්තරයකින්ය.




**3.19 රූපය** ඇත් හැට්ටයේ බෝඩරය සහ ඇතුළත හැඩ වෙන් කිරීම සඳහා ලියවැල් යොදා ගත් අවස්ථාවක්.

### 3.8.12. ඉර හඳ

සදාකාලිකභාවයේ සංකේතය ලෙස ගැනෙන ඉර සහ හඳ සිංහල සැරසිලි මෝස්තර වර්ගීකරණයේ එක් ප්‍රභේදයක් වන දිව්‍ය ගණයට අයත් වේ. මහනුවර ඇසළ පෙරහැර මංගල්‍යයේ හස්ති වස්ත්‍ර සැරසිලි මෝස්තර අතරත් ඉර හඳ දක්නට ලැබීම විශේෂත්වයකි. එහිදී අලි ඇතුන්ගේ හිසේ සිට සොඬ දක්වා කොටස ආවරණය වන පරිදි නිමැවෙන නෙත්තිමාලයේ ඉර හඳ යොදා ඇත්තේ කුම්භස්තලය මත පිහිටන ආකාරයෙනි. සුලබව නොවුණත් කිහිප විටකදී ම කන්පෙති සැරසීම සඳහාත් ඉර හඳ භාවිත විය.

**3.20 රූපය** නෙත්තිමාලය හැඩ කිරීම සඳහා ඉර හඳ යොදා ගත් අවස්ථාවක්.





### 3.8.13. වෙනත්

දළදා පෙරහැර වෙනුවෙන් නිමවෙන හස්ති වස්ත්‍ර සඳහා යොදා ගන්නා සැරසිලි මෝස්තර අතර සාම්ප්‍රදායික සිංහල සැරසිලි මෝස්තර කලාවෙන් මෙපිට සිට සිදු කරන ලද නිර්මාණ ද වෙයි. ඒ ඒ නිර්මාණ ශිල්පියා සහ ඔහුගේ නිර්මාණාත්මකභාවය අනුව විවිධ වන මේවාට සිතුවම්, නවීන හැඩතල සහ සාම්ප්‍රදායික මෝස්තර ඇසුරෙන් නිර්මාණය කරගත් නව මෝස්තර රටා අයත්ය.

2019 වසරේ කුඹල් පෙරහැරේ සධාතුක කරඬුව වැඩම කරවූ මංගල හස්තියා සහ දෑළ ඇතුන් දෙදෙනාට අන්දවන ලද ඇඳුමෙහි ඇත් හැට්ටය අලංකාර කර තිබුණේ දන්ත කුමරුගේ හා හේමමාලා කුමරියගේ රුව යොදා ගනිමිනි. ඊට පෙරත් වසර කිහිපයකදී ම පෙරහැර අලි ඇතුන්ගේ ඇඳුම් සඳහා මෙම රූපය භාවිත විය. දළදා පෙරහැරේ සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියාගේ ඇඳුම් කට්ටලයේ වුව හේමමාලා සහ දන්ත කුමරු දන්ත ධාතුව රැගෙන ඒමේ සිදුවීම විචිත්‍රවත්ව නිරූපණය කර ඇත්තේ දළදා වහන්සේ සමඟ දක්වන එම

සමීප සබඳතාව හේතුවෙනි. තදානි මහතා විසින් නිර්මාණය කරන ලද හස්ති වස්ත්‍රවල හේමමාලා සහ දන්ත දෙදෙනාගේ රුව බහුලව දක්නට ලැබෙයි.

සිංහල සැරසිලි මෝස්තර අතර මහනුවර යුගයේ වඩා ජනප්‍රිය වූ සහ බෞද්ධ සංස්කෘතිය සමඟ දැඩි හිතවත්කමක් සහිත රූ, හස්ති වස්ත්‍රයේ අනිවාර්යයයෙන් දැකිය හැකිය. නවීන පන්නයට සරිලන ආකාරයට පැරණි සිංහල මෝස්තර ඇසුරින් ගොඩනගා ගත් සැරසිලි මෝස්තර හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන් අතර අද වන විට ජනප්‍රිය අංගයක් වී ඇති බව මෑත වසර කිහිපයකදී ම දළදා පෙරහැර සඳහා නිර්මාණය කරන ලද හස්ති වස්ත්‍ර විමසීමෙන් පෙනේ. පැරණි සැරසිලි කලාවේ බහුලව දක්නට ලැබුණු දිය රැල්ල, කුන්දිරික්කන්, ගල් බිංදුව, බෝපත්, පනාව හා පතුරු වැනි මෝස්තර රටා ද වර්තමානයේ දී හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීහු නවාකාරයකින් සැරසිලි කාර්යයට යොදා ගනිති. එවැනි හස්ති වස්ත්‍ර බොහෝවක් මාළිගාව සතුවේ.

### 3.9. ඇණවුම් කිරීම හා මිල ගණන්

හස්ති වස්ත්‍රයක් සඳහා වැය වන මුදල ඇඳුමෙන් ඇඳුමට වෙනස් වෙයි. ඇඳුමේ හැඩය. වැඩ දමන ප්‍රමාණය අනුව ද එහි වෙනස්කම් පවතී. විශේෂයෙන් ම සාමාන්‍ය හස්ති වස්ත්‍රයකට වඩා කරඬුව වැඩම කරවන ඇඳුමක් සඳහා වැඩි මුදලක් වියදම් කළ යුතුය. අනෙක් ඇඳුම්වලට වඩා කරඬුව වැඩම කරවන ඇඳුම විශේෂයෙන් සකස් කළ යුතු වීම ඊට හේතුවයි. ඒ වෙනුවෙන් යොදන මෝස්තර ප්‍රමාණය ද වැඩිය. එම නිසා අනෙක් හස්ති වස්ත්‍ර ඊට සාපේක්ෂව අඩු මුදලකට ලබාගත හැකිය. සාමාන්‍ය හස්ති වස්ත්‍රයක් සඳහා රුපියල් ලක්ෂ දෙකක පමණ මුදලක් වැය වුවත් කරඬුව වැඩම කරවන ඇඳුමක් සඳහා රුපියල් ලක්ෂ පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් වැය වන අවස්ථා ද ඇත. එය තීරණය වන්නේ ඇඳුම සකස් කිරීමට ලබා දෙන පුද්ගලයාට අවශ්‍ය ඇඳුමේ සැලැස්ම හා වැඩ දැමීම මතයි.

මහනුවර ඇසළ පෙරහැර සඳහා වූ අලි ඇතුන් වෙනුවෙන් ඇඳුම් නිර්මාණය කර ඒවා මාළිගාවට භාර දීමට හැකිය. එම නිසා හස්ති වස්ත්‍ර මැසීමට හැකි ශිල්පීන් වෙත පැමිණෙන පිරිස් බොහෝවකි. සාමාන්‍යයෙන් හස්ති වස්ත්‍රයක් සකස් කිරීම සඳහා සැලකිය යුතු කාලයක් වැයවේ. එය මාස තුනක් හෝ ඊට වැඩි විය හැකිය. එම නිසා පෙරහැර පැවැත්වෙන කාලයට අවම වශයෙන් මාස 4කට හෝ 5කට පෙරදීවත් හස්ති වස්ත්‍රයක් ඇණවුම් කිරීම නැතහොත් මැසීම සඳහා භාර දීම වඩා සුදුසුය.[91]

## 3.10. හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන්

ලංකාවේ හස්ති වස්ත්‍ර නිර්මාණය කර්මාන්තයක් වශයෙන් සිදු කරන ශිල්පීන් නොමැති තරම්ය. වසරේ එක් කාලයකට පමණක් පෙරහැර මංගල්‍යයන් පැවැත්වීම නිසා පූර්ණ කාලීනව ඒ වෙනුවෙන් කැපවීමට අවශ්‍යතාවක් නොමැති වීම ඊට හේතුවයි. නමුත් මෙරට ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ හස්ති වස්ත්‍ර නිර්මාණකරණයේ නියුතු ශිල්පීන් සිටින්නේ බොහෝ ම සුළු ප්‍රමාණයකි. ඒ අතරින් මහනුවර දළදා මාළිගාවට සම්බන්ධව නුවර පෙරහැර වෙනුවෙන් හස්ති වස්ත්‍ර නිර්මාණය කරන ශිල්පීන් කිහිප දෙනෙකු වෙයි. මේ අය අතරින් ඉදිරියෙන් ම සිටින්නේ කේ. සී. තදානි මහතාය.

ඉන්දියානු සම්භවයක් සහිත තදානි මහතා, ශ්‍රී ලංකාවේ සිටි අග්‍රගණ්‍ය හස්ති වස්ත්‍ර නිර්මාණකරුවන් අතර මුල් තැන ගන්නා අයෙකි. ඔහු ලංකාවේ පෙරහැර මංගල්‍ය වෙනුවෙන් වසර 55ක කාලයක් සේවය කළේය. මහනුවර දළදා පෙරහැරේ සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියාගේ සහ සෙසු හස්තීන්ගේ ඇඳුම් වසර ගණනාවක සිට ම නිර්මාණය වන්නේ තදානි මහතා අතිනි. 1938 දී ඉන්දියාවේ තෙලංගා ප්‍රාන්තයේ හයිද්‍රාබාද්හි දහසය දෙනෙකුගෙන් යුත් පවුලේ 13 වැනියා වූ ඔහු යුද ගැටුම් හේතුවෙන් ලංකාවට පැමිණේ. අධ්‍යාපනය ලබන්නේ මහනුවර ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයෙනි. මහනුවර අස්ගිරිය ප්‍රදේශයේ

---

91 අසංග, 2022.05.02

ජීවත් වූ නිසා දළදා මාළිගාවත් ඇසළ පෙරහැරත් ඔහුට ආගන්තුක වූයේ නැත. ඔහු දුටු ඇසළ පෙරහැරක අලි ඇතුන්ගේ ඇඳුම ඉදිරිපස පමණක් අලංකාරව සකස් කරන ලද නමුත් ඇඟට රෙද්දක් දමා ලණුපටකින් බැඳ සකස් කරන ලද්දකි. පසුව අලියෙකුගේ ඩමියක් ගෙන එයට සරිලන පරිදි රෙදි කපා මෝස්තර දමා ඇඳුමක් නිර්මාණය කිරීමට තදානිට හැකියාව ලැබුණි.

තදානි මහතා විසින් 1969දී සකස් කර දළදා මාළිගයට භාර දුන් එම ඇඳුම ඇසළ පෙරහැර වෙනුවෙන් පූජාවක් ලෙස හිමි වූ පළමු හස්ති වස්ත්‍රයයි. එය එම්බෝස් ක්‍රමයට මෝස්තර නිමවා ඉදිරිපස හා පසුපස පූර්ණ වශයෙන් ආවරණය වන පරිදි මසා නිම කළ ඇඳුමකි. හස්ති වස්ත්‍රයක් සඳහා තදානි කිසිම දිනක මිම්මක් භාවිත නොකරයි. ඔහු පවසන්නේ අලියෙකු දුටු පමණින් එම අලියාගේ මිම්ම තමාගේ හිතට එන බවය. එය දෙවියන්ගෙන් තමන්ට ලැබුනු වරමක් යැයි සිතෙන බව ඔහු කියයි. නිවැරදි මිම්මක් ලෙස අදටත් පවතින්නේ ද අනෙක් හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන් භාවිතයට ගන්නේ ද තදානි මහතාගේ මෙම මිනුම් ක්‍රමයි. ස්වීක්වින්ස් සහ බීඩ්ස් යොදා ගෙන සිදු කරන දකුණු ඉන්දීය **"ආරිවර්ක්"** හෙවත් අතින් ඉදිකට්ට භාවිතයෙන් මෝස්තර දැමීමේ ක්‍රමය මොහුගේ නිර්මාණවල අනන්‍ය ලක්ෂණයකි. දකුණු ඉන්දීය ක්‍රමය වුවත් මහනුවර යුගයට අයත් සිංහල සැරසිලි මෝස්තරවලට ප්‍රමුඛත්වය ලබා දුනි. මතුපිටින් වෙල්වට් රෙද්දෙන් ද මැදට පැඩින් එකකින් ද ඇතුළත සඳහා කපු පුලුං ආවරණයක් ද සහිතව නිමැවෙන තදානිගේ හස්ති වස්ත්‍රය සැම විට ම හස්තියාගේ සනීපාරක්ෂාව පිළිබඳ විශේෂ සැලකිල්ලක් යොමු කළ ඇඳුමක් විය. මේ නිසා ම 90 දශකයේ මුල් භාගය වන විට තදානිගේ හස්ති වස්ත්‍ර සඳහා ඉහළ ඉල්ලුමක් ලැබිණි. ලංකාවේ පෙරහැර මංගල්‍යයන්ට පමණක් නොව රාජ්‍ය උත්සවවලටත් අලි ඇතුන්ට ඇන්දවීම සඳහා යොදා ගත්තේ මෙම නිර්මාණය. වාර්ෂිකව ඇඳුම් පනහක් පමණ නිර්මාණය කරන ඔහු මිය යන විට අලි ඇඳුම් 1500කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර තිබුණේය.[92]

[92] https://youtu.be/pBodj4aYRngml

### 3.11. දළදා පෙරහැරෙහි හස්ති වස්ත්‍රාභරණ නිර්මාණය සම්බන්ධ අනන්‍යතා ලක්‍ෂණ

ලංකාවේ හස්ති වස්ත්‍ර නිර්මාණකරණය ගොඩනැගෙන්නේ පෙරහැරවල් 4ක් මූලික කරගෙනය. එනම්, මහනුවර ඇසළ මහා පෙරහැර, කෝට්ටේ රජමහා විහාරයේ ඇසළ පෙරහැර, කැලණිය රජමහා විහාරයේ ඇසළ පෙරහැර සහ රත්නපුර සමන් දේවාලයේ පෙරහැර වශයෙනි. මෙම පෙරහැරවල් සතර සඳහා හස්ති වස්ත්‍ර නිර්මාණය වන්නේ සිවු ආකාරයකටය. කතරගම පෙරහැරක් පැවැත්වුව ද ඒ වෙනුවෙන් අලි ඇඳුම් සකස් කිරීමට වෙනම ක්‍රමවේදයක් නැත. කතරගම පෙරහැරට ගෙනෙන අලි ඇඳුම් සෑම එකක් ම පාහේ තදානි මහතා විසින් නිර්මාණය කරන ලද ඒවාය. පසුගිය අවුරුදු කිහිපයක පටන් නුවර පෙරහැරට මෙම සතර ආකාරයට ම මසන ලද අලි ඇඳුම් එකතු විය. නමුත් සාමාන්‍යයෙන් නුවර පෙරහැර සඳහා හස්ති වස්ත්‍ර නිර්මාණය වන්නේ උඩරට සම්ප්‍රදායට අනුවයි. මෑත කාලයක් වන තුරු ම නුවර පෙරහැරේ ගමන් කළ අලි ඇතුන්ට ඇන්දවූයේ තදානි විසින් නිර්මාණය කරන ලද ඇඳුම් පමණි. කෝට්ටේ පෙරහැරට ලබා ගන්නේ කෝට්ටේ විහාරස්ථානයේ පිරිස විසින් නිර්මාණය කරන ලද අලි ඇඳුම් පමණි. නමුත් මාළිගාවේ නම් අද වන විට තත්ත්වය කරමක් වෙනස් වී ඇත. එහෙත් සේවාව ලබා ගැනීමේදී තෝරාගත් ශිල්පීන් කිහිප දෙනෙක් පමණක් ඇසුරු කරන බව පෙනේ. එම නිසා නුවර පෙරහැරේ හස්ති වස්ත්‍ර සම්බන්ධයෙන් හඳුනාගත හැකි ලක්ෂණ කිහිපයකි.[93]

දළදා පෙරහැර, කුඹල් පෙරහැර පහකින් සහ රන්දෝලි පෙරහැර පහකින් සමන්විත වෙයි. මේ සෑම පෙරහැරකට ම අවසානයේ දී සිවු මහා දේවාලයවල පෙරහැර ද එකතු වේ. මේ අතරින් කුඹල් පෙරහැර සඳහා හස්ති වස්ත්‍රය සුදු පැහැයෙන් හෝ ඇත් දළ පැහැයෙන් නිර්මාණය වේ. එය පෙරහැර සංස්කෘතිය තුළ නුවර පෙරහැරේදී පමණක් දැකිය හැකි ලක්ෂණයකි. විශේෂත්වය නම්, පෙරහැරට සම්බන්ධ වන සෙසු ශිල්පීන්ගේ ඇඳුම් පැලඳුම්වලට මෙහි බලපෑමක් නොවීමයි. හින්දු

93 අසංග, 2022.05.02

සංස්කෘතියේ ආභාසය ලැබූ කතරගම දේවාලයේ පෙරහැරේ වුව අලි ඇඳුම් සඳහා එවැනි විශේෂ වර්ණ භාවිතයක් දැකිය නොහැකිය.

නුවර පෙරහැරේ සධාතුක කරඬුව වැඩම කරවන මංගල හස්තියාගේ ඇඳුම සහ දියවඩන නිලමේතුමාගේ ඇඳුම අතර අපූර්ව සම්බන්ධයක් ද ඇත. පෙරහැර කරඬුවට පසුගමන් ගන්නා දියවඩන නිලමේතුමාගේ ඇඳුම ඒ ඒ දිනය වෙනුවෙන් මංගල හස්තියා අඳිනු ලබන ඇඳුමේ වර්ණයට සමාන වෙයි. එය අතීතයේ පටන් දළදා මාළිගාවේ පවතින සම්ප්‍රදායකි. සාමාන්‍යයෙන් නුවර පෙරහැරේ ගමන් ගන්නා අලි ඇතුන් වෙනුවෙන් අවශ්‍ය වන හස්ති වස්ත්‍ර සෑම වසරක් පාසා ම නොයෙක් දානපතියන් විසින් මාළිගයට පරිත්‍යාග කරන ලදහ. මංගල හස්තියාගේ සහ දැලේ ගමන් ගන්නා ඇතුන් දෙදෙනාගේ ඇඳුම් කට්ටල ද ඒ ආකාරයට සෑම වසරකදී ම අලුතෙන් ම නිර්මාණය කර මාළිගයට ලබා දේ. එම නිසා පෙරහැරෙන් පෙරහැරට කරඬුව වැඩම කරවන හස්තියාගේ ඇඳුමේ වර්ණයත් මෝස්තර රටාත් වෙනස් වෙයි.

හස්ති වස්ත්‍ර සඳහා යොදා ගන්නා මෝස්තර රටා සහ ඇඳුමේ කොටස් එකට එකතු කර මැසීම පවා සිදු වන්නේ උඩරට සම්ප්‍රදායට අනුගතවයි. හස්ති වස්ත්‍රයට අයත් ඇත් හැට්ටය, හස්තියාගේ පසුපස ප්‍රදේශය ද ආවරණය වන ආකාරයෙන් සකස් කර තිබීම නුවර පෙරහැරේ හස්ති වස්ත්‍රවලට ම ආවේණික ලක්ෂණයකි. සාමාන්‍යයෙන් හස්තියෙකුට ඇඳුමක් අන්දා නිම කළ පසු ඒවා හස්තියාගේ ඇඟට සම්බන්ධ කර ඇති ආකාරය පිටත සිටින අයෙකුට හොඳින් දර්ශනය වේ. එය එතරම් ප්‍රියජනක දසුනක් නොවේ. එම නිසා නුවර පෙරහැරට අලි ඇඳුම් නිර්මාණය කරන තදානි මහතා විසින් හස්තියාගේ පසුපස ප්‍රදේශය ද ආවරය වන ආකාරයට හස්ති වස්ත්‍රනිර්මාණය කිරීම ආරම්භ කරන ලදි. කතරගම පෙරහැරට හස්ති වස්ත්‍ර ලබා ගන්නේ ද තදානි මහතාගෙන් නිසා කතරගම පෙරහැරේ ගමන් ගන්නා අලි ඇතුන්ගේ ඇඳුමේත් මෙම ලක්ෂණය දැකිය හැකිය. නමුත් කෝට්ටේ රජමහා විහාරයේ ඇසළ පෙරහැරෙහි හස්ති වස්ත්‍රවල පසුපස ආවරණය වීමක් දක්නට නොලැබේ.

මංගල හස්තියාගේ ඇඳුම් කට්ටලයට අයත් වන වතපුටුව,

රන්සිවිගෙය සහ කරඬුව තැන්පත් කරන ආසනය යනාදී සෑම මෙවලමක් ම මහනුවර දළදා මාළිගාවට ම ආවේණික වූ සහ විශේෂ වූ ඒවාය. කුඹල් පෙරහැර, දේවාලය පෙරහැර සහ රන්දෝලි පෙරහැර වශයෙන් වෙනස් වන පෙරහැරවලදී පෙරහැරේ ගෙන යන රන්සිවිගෙය ද වෙනස්වේ. පෙරහැරට පළමු වරට රන්සිවිගෙයක් නිර්මාණය කර භාරදී ඇත්තේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ කාලයේදීයි. එම රන්සිවිගෙය මහනුවර දළදා මාළිගා කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. සාමාන්‍යයෙන් රන්දෝලි පෙරහැරේ ගෙන යන රන්සිවිගෙය කිලෝ ග්‍රෑම් 50ක පමණ බරකින් යුක්තය. එය නිර්මාණය කර ඇත්තේ රිදියෙන් සහ හොඳ ලී වර්ගයකිනි. අනෙක් විහාරස්ථානවල හෝ දේවාලයවල පෙරහැරේ ගෙන යන රන්සිවිගෙයට වඩා නුවර ඇසළ පෙරහැරේ පෙරහැර කරඬුව වැඩම කරවන රන්සිවිගෙය විශේෂ වන්නේ එම නිසාය. නුවර පෙරහැරේ කරඬුව තැන්පත් කරන රන්සිවිගෙය බඳින්නේ වතපුටුව මතයි. මෙම වතපුටුව තරමක් බරැති සනකම් ලෝහයකින් සකස් කර ඇති නිසා අනෙකුත් ඒවාට වඩා විශේෂ වේ. මේවායෙහි එන කැටයම් මෝස්තර පවා නුවර යුගයට ආවේණික වූ හැඩ රටාවන්ගෙන් සකස් වූ ඒවාය. රන්සිවිගෙය තුළ සධාතුක කරඬුව තැන්පත් කිරීම සඳහා විශේෂයෙන් සකස් කළ වෙන ම ආසනයක් ද ඇත. මේවා පෙරහැර අනුව විවිධ වෙනස්කම් සහිත වුවත් පොදුවේ බැලූ විට දළදා මාළිගයට ම ආවේණික වූ ලක්ෂණ පෙන්වයි.[94]

## 4. සමාලෝචනය හා නිර්දේශ

හස්තියා සංස්කෘතික උරුමයක් වශයෙන් මිනිසුන්ගේ වන්දනාමානයට පාත්‍ර වන්නේ පෙරහැර සංස්කෘතියට අලි ඇතුගෙන් ලැබෙන දායකත්වය නිසාය. නමුත් පෙරහැරෙහි විචිත්‍රත්වය රඳා පවතින්නේ අලි ඇතුන්ගේ සහභාගිත්වය නිසා ම නොව ඔවුන් හැඩ කරන ඇඳුම් කට්ටලය ද ඊට ප්‍රබල බලපෑමක් කරයි. සංස්කෘතිකාංගයක් වශයෙන් පෙරහැර මංගල්‍ය මෙතෙක් අඛණ්ඩව පැවතගෙන එන්නේ ද

[94] ඇළමල්පේ, 2022.04.04

ඒ නිසාය. එබැවින් තිරිසන්ගත සත්ත්වයෙකු වස්ත්‍රාභරණයෙන් සැරසීම සිංහල සංස්කෘතිය හා බැඳුණු විශේෂිත කරුණක් වන්නා සේ ම හස්තියාගේ වස්ත්‍රාභරණ නිර්මාණය හා භූෂණය ගෞරවය හා භක්තිය පදනම් කරගත් සංස්කෘතික අංගයක් බව මෙමඟින් නිගමනය කළ හැකිය. හස්ති වස්ත්‍රාභරණකරණය ක්ෂේත්‍රයක් වශයෙන් ගත් කල පවතින තත්ත්වයට වඩා ඉදිරියට යා හැකි නමුත් ඒ සඳහා නිසි මග පෙන්වීමක් නොලැබීම නිසා අභියෝග ගණනාවකට ද මුහුණ දෙයි. අලි ඇතුන් සම්බන්ධයෙන් ගත්තද පෙරහැර මංගල්‍ය සහ හස්ති වස්ත්‍ර සම්බන්ධයෙන් ඍජුව ම ඉලක්ක වන්නේ හීලෑ අලි ඇතුන්ය. වන අලියාට ඇඳුම් ඇන්දවීම හෝ පෙරහැරට සහභාගි කර ගැනීමක් සිදු නොවීම ඊට හේතුවයි. මෙම පර්යේෂණය දළදා මාළිගාව ඇසුරෙන් වුව ද ලංකාවේ පවත්වන පෙරහැර මංගල්‍යයන් එකිනෙකින් වෙන් වෙන් ව ගෙන බැලීමේදී හස්ති වස්ත්‍ර නිර්මාණයේ හෝ භූෂණයේ විශේෂතා ගණනාවක් දකින්නට ලැබේ. එබැවින් හස්ති වස්ත්‍ර හා පෙරහැර මංගල්‍ය සම්බන්ධයෙන් ඉදිරියට සිදු කෙරෙන පර්යේෂණවලදී ප්‍රයෝජනයට ගත හැකි පරිදි මෙම අධ්‍යයනයෙන් අවධානයට ලක් වූ කරුණු කිහිපයක් සම්බන්ධයෙන් පහත නිර්දේශ ඉදිරිපත් කරමි.

- හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පීන්ගේ ඇතැම් ගැටලු විසඳීම සඳහා රජය මැදිහත් වී කටයුතු කිරීම අනිවාර්ය වේ. විශේෂයෙන් ම ඉන්දියාව වැනි රටවලින් අමුද්‍රව්‍ය ගෙන්වීමේදී එක් එක් ශිල්පියා වෙන් වෙන් වශයෙන් ඒ සඳහා යොමු වීමේදී ඇති වන අපහසුතාවය, ප්‍රමාද වීම හෝ අමුද්‍රව්‍ය අක්‍රමවත් ආකාරයෙන් බෙදී යාම වැනි කරුණු මගහැරවීමට රජය මැදිහත් වී එක් නිශ්චිත ක්‍රමවේදයකට අනුව අවශ්‍ය වන අමුද්‍රව්‍ය ප්‍රමාණය ගෙන්වීමටත්, ඒවා අදාළ ශිල්පීන් අතර බෙදා දීමටත් නිසි වැඩපිළිවෙළක් සකස් කළ යුතුය.

- ඕනෑම දෙයක පැවැත්ම රඳා පවතින්නේ එහි ඉදිරි ගමන තහවුරු කිරීම සඳහා යොදා ගන්නා ක්‍රම විධිවල ස්වභාවය මතයි. හස්ති

වස්ත්‍ර නිර්මාණකරණයෙහි ද අනාගතයේදී උර දීමට හැකි මීළඟ පරම්පරාවක් සූදානම් කළ යුතුය. එසේ ම දැනට එම කාර්යයයේ නියුතු ශිල්පීන්ට නිසි මග පෙන්වීමක් ලබා දීමත්, නවෝත්පාදන වෙත යොමු කරවීමත් වැදගත් වෙයි. මෙරට හස්ති වස්ත්‍ර සඳහා ජාත්‍යන්තර මට්ටමෙන් වෙළඳපොළ අවස්ථා හිමි කර දීම ද සිදු කළ යුතුව ඇත.

## 5. මූලාශ්‍රය

### සිංහල පොත්පත්


අතපත්තු, නන්දන. (2018). *අවසාන කුංචනාදය*. කොළඹ: සූසර ප්‍රකාශකයෝ.

අමරකෝන්, ඉන්ද්‍රානි. හද්‍රා. (පරි:) (2017). *පැරණි ලක්දිව ජීවිත පුවත්*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අල්විස්, ප්‍රේමචන්ද්‍ර. (පරි:) (2009). *නොක්ස් දුටු ලක්දිව*. කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

අල්විස්, ප්‍රේමචන්ද්‍ර. (2001). *ලක් බිමේ සත් වසක්*. කොළඹ: සූරිය ප්‍රකාශකයෝ.

ආටිගල, අසංග. (2015). *පෙරහැර විත්ති*. වරකපොල: හෙළදිව ප්‍රකාශකයෝ.

ආරියපාල, බී. ඇම්. (2014). *මධ්‍යකාලීන ලංකා සමාජය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඒකනායක, ඒ. එච්. (2006). *ජෝන් ඩේවි සහ උඩරට සිංහලයෝ*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කරුණාතිලක, පී. ඩී. ඒ. (1958). *සෙන්කඩගලපුර ඉතිහාසය*. සේනාධිපති විජේරත්න රඹුක්වැල්ලේගේ ප්‍රකාශන.

කරුණාරත්න, ඩේවිඩ්. (2013). *එදා හෙළදිව*. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

කුමාරස්වාමි, ආනන්ද. කේ. (1994). *මධ්‍යකාලීන සිංහල කලා*. කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන.

ගුණවර්ධන, එස්. වී. ඩී. (2008). *දාඨාවංශය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයකොඩි, චන්ද්‍ර. සරත්. (1999). *සිරි දළදා පවත*. කොළඹ: සුදීර පොත්හල.

ජයවර්ධන, ඩබ්. එච්. (1964). *පිළි මුද්‍රණය*. රාජ්‍ය භාෂා දෙපාර්ථමේන්තුවේ ප්‍රකාශන.

ජයවර්ධන, සී. පී. ආර්. (2014). දකුණු ආසියානු බෞද්ධ කලාවේ සංකේත. වරකපොල: ආරිය ප්‍රකාශකයෝ.

දසනායක, බී. ඇම්. (1994). *කන්ද උඩරට ඇසළ පෙරහැර*. කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.

දිසානායක, මුදියන්සේ. (2009). *ශ්‍රී ලංකාවේ දමිළ සංස්කෘතිය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිල්ශාන්, උමයංග. තාරක. (2018). *හස්තිරාජ වංශය*. කර්තෘ ප්‍රකාශන.

ධර්මබන්දු, සනත්. (2009). *චිත්‍ර හා මූර්ති කලාව*. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

පීරිස්, රැල්ෆ්. (2016). *සිංහල සමාජ සංවිධානය*. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

මාලිමගේ, අසෝක. (2012). *කතරගම දෙයියෝ*. කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

රාජපක්ෂ, ඩබ්. එම්. එස්. (2015). *දළදා මහිම*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රණතුංග, චාල්ස්. (2010). *බුදු සමය හා කලාව*. කර්තෘ ප්‍රකාශන.

රත්නායක, උපාලි. (2016). *ඩොයිලි දුටු උඩරට රාජ්‍යය*. කොළඹ: ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්.

වජිර, කුඹුරුගමුවේ. (2008). *දළදා ඉතිහාසය සහ සංස්කෘතිය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විජේරත්න, ජයන්ත. එම්. එච්. (2018). *සබරගමු මහ සමන් දේවාලය සහ රත්නපුර සෙසු දේවාල*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

වීරසූරිය, ගුණසිරි. (2006). *සිංහල සමාජය හා සංස්කෘතිය*. වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

සිල්වා, ඉන්දික, එච්. ටී. (2019). සෙංකඩගල උරුමය. ගම්පහ: මින්සර ප්‍රකාශකයෝ.

සෙනෙවිරත්න, අනුරාධ. (2001). *සිරි දළදා වරුණ.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාරත්න, ඇම්. පී. (2001). *ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හේවාපතිරණ, දයා. (2012). *ශ්‍රී ලංකාවේ විහාරාශ්‍රිත සිතුවම් කලාව.* කොළඹ: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**ඉංග්‍රීසි පොත්පත්**

Marshall. John. (1960). *The Buddhist Art of Gandhara.* London: The Syndics of Cambridge University Press.

**සම්මුඛ සාකච්ඡා**

ආර්. එන්. රාජපක්ෂ, අවු. 56, වෘත්තිය - හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පී, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - 43/4 D1, ධම්දසිද්ධි මාවත, පස්දුල්ල, මහනුවර. (2021.02.18 දින සම්මුඛ සාකච්ඡාව)

එම්. සාගරිකා තිරිමාන්න, අවු. 46, වෘත්තිය - හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පී, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - 275/4 A, පළවෙනි පටුමග, පල්ලේමුල්ල, පානදුර. (2022.02.15 දින සම්මුඛ සාකච්ඡාව)

කැලුම් සංජීව, අවු. 37, වෘත්තිය - හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පී, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - 546, කහබිලියා වත්ත, පන්විල, රුක්ගහවිල. (2022.03.06 දින සම්මුඛ සාකච්ඡාව)

කේ. සී. තදානි, අවු. 83, වෘත්තිය - හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පී, ජාතිය - ඉන්දියානු, ආගම - හින්දු, ලිපිනය - නුවර, (2020.04.23 දින සම්මුඛ සාකච්ඡාව)

ජයතිස්ස බණ්ඩාර ඇහැළමල්පේ, අවු. 66, වෘත්තිය - මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ මංගල හස්තියා සැරසීමේ රාජකාරිය (ගුරුදෙණිය විදානේ), ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - ශ්‍රී සුමන මාවත, හාරගම, ගුරුදෙණිය. (2022.04.04 දින සම්මුඛ සාකච්ඡාව)

ප්‍රදීප් මියනපලාව, අවු. 41, වෘත්තිය - මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ ඇත් පන්තිය භාර ගජනායක නිලමේ, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - දළදා මාළිගාව චතුරස්‍රය, හේමමාලි මාවත, මහනුවර. (2022.02.02 දින සම්මුඛ සාකච්ඡාව)

ළහිරු අසංග සිරිනායක, අවු. 35, වෘත්තිය - හස්ති වස්ත්‍ර නිර්මාණ ශිල්පී, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - 15/07, ජයන්ත මාවත, මිරිහාන, කෝට්ටේ. (2022.05.22 දින සම්මුඛ සාකච්ඡාව)

වැද්දාගල ජයම්පති, අවු. 64, වෘත්තිය - මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ සම්බන්ධීකරණ ලේකම්, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - ශ්‍රී දළදා මාළිගාව, මහනුවර. (2020.05.22 දින සම්මුඛ සාකච්ඡාව)

විස්කම් සෞභාග්‍ය විජේරත්න, අවු. 28, වෘත්තිය - Voice for Elephant Sri Lanka සංවිධානයේ හිටපු ප්‍රධානී සහ හිටපු සභාපති, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - 'විස්කම්', දේවාල හන්දිය, රිදීගම. (2021.11.23 දින සම්මුඛ සාකච්ඡාව)

හර්ෂණ ඉසිර කොඩිතුවක්කු, අවු. 22, වෘත්තිය - ශිෂ්‍ය, ජාතිය - සිංහල, ආගම - බෞද්ධ, ලිපිනය - නො. 78, ප්‍රධාන මාවත, දිඹුල, පතන. (2020.05.27 දින සම්මුඛ සාකච්ඡාව)

**අන්තර්ජාල යොමු**

**සිංහල**

**අබේසිරි ගුණවර්ධන, කුසුමා** (2021), (Online), Available at: https://www.lankasinhalagossip.net/2021/02/12/12815/

**ඉරිදා ලංකාදීප** (2014), (Online), Available at: https://www.lankadeepa.lk/sunday/latest_news/%E0%B6%B8%E0%B7%84-%E0%B6%B1%E0%B7%94%E0%B7%80%E0%B6%BB-A%E0%B7%92/1-249134

**එරන්ද** (2015), (Online), Available at: https://dhamma.ifbcnet.org/%E0%B7%83%E0%B7%92%E0%B6%BB%E0%B7%92-%E0%B6%AF%E0%B7%85%E0%B6%AF%E0%B7%8F-

**පෙරේරා, බණ්ඩාර, ඉනෝකා** (2019), (Online), Available at: https://www.silumina.lk/2019/08/10/%E0%B7%80%E0%B7%92%E0%B7%81%E0%B7%9A%E0%B7%82%E0%B7%8F%E0%B6%82%E0%B6%9C/%E0%B6%B4%

**ප්‍රභාත්, අත්තනායක** (2022), (Online), Available at: https://thinksrilanka.net/%E0%B6%85%E0%B7%80%E0%B7%94%E0%B6%BB%E0%B7%94%E0%B6%AF%E0%B7%94-60%E0%B6%9A%E0%B7%8A-

**බණ්ඩාර, කුමාර, සිසිර** (2022), (Online), Available at: https://www.lankadeepa.lk/Nimthera/%E0%B6%85%E0%B6%BD-%E0%B6%87%E0%B6%AD%E0%B6%B1-%E0%B6%B1%E0%B6%AD

**විජයවර්ධන, කුසුම්සිරි** (2021), (Online), Available at: https://roar-media.cdn.ampproject.org/v/s/roar.media/sinhala/main/history/dalada-rituals-and-officers/amp?amp_gsa=1&amp_js_v=a9&usqp=mq331AQKKAFQArABIIACAw%3

**ඉංග්‍රීසි**

Ada Derana 24 (2016), (Online), Available at: https://youtu.be/4m7BAjcSZOQ

Buddaghosha (2012), (Online), Available at: https://youtu.be/0-rEOuY_1Kw

CharithManiya (2019), (Online), Available at: https://youtu.be/-JMMWb1ZH14

Explore Srilanka (2018), (Online), Available at: https://youtu.be/qJQgYDzXs4M

Fox Talks, (Online), Available at: http://foxtalccs.blogspot.com/2016/05/blog-post_42.html?m=1

News.lk (2016), (Online), Available at: https://sinhala.news.lk/news/political-current-affairs/item/18403-35

Only Sylvestrian (2020), (Online), Available at: https://www.facebook.com/1977162339223607/posts/pfbid0bZC99b5PH5QHpppfiA52T1A2E2UF4dCkdjyLTJ8udYoridQ8aAv7tkcDjMGhLThel/?sfnsn=mo

Shane Shalless (2019), (Online), Available at: https://youtu.be/dBvn7Eawoec

Travelfish.ORG, (Online), Available at: https://www.travelfish.org/sight_profile/thailand/northern_thailand/lampang/lampang/1798

Travel with Wife (2020), (Online), Available at: https://youtu.be/qGtHgBNBFgQ